**2023 ජනවාරි මාසයට අදාළව 2023.01.17 දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය මාසික සභා රැස්වීම් වාර්තාව.**

---

❖ **<u>සහභාගිත්වය:</u>**

| | | |
|---|---|---|
| 01. | රංජිත් පියදිගම මැතිතුමා | - ගරු සභාපති |
| 02. | ආර්.එම්.කාන්ත බිමල් රත්නායක මැතිතුමා | - ගරු උප සභාපති |
| 03. | ඒ.එම්.ප්‍රේමපාල මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 04. | ජේ.ජී.නිමල් සරත් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 05. | එම්.ඒ.එම්.ෂබ්රි මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 06. | ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 07. | එම්.ඒ.එම්.රසීදු මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 08. | කේ.එම්.ජයසුන්දර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 09. | පී.එම්.අමරපාල මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 10. | ජී.එච්.කෝකිල රුෂාන් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 11. | ආර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 12. | ආර්.එම්.තුෂාරී ප්‍රියදර්ශනී රත්නායක මැතිණිය | - ගරු මන්ත්‍රිනී |
| 13. | යූ.ටී.එම්.තරංගා චිත්‍රාණී පුෂ්පලතා මැතිණිය | - ගරු මන්ත්‍රිනී |
| 14. | පී.අයේෂා චතුර්ණිමා කුෂාන්ති මැතිණිය | - ගරු මන්ත්‍රිනී |
| 15. | ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමා | - ගරු මන්ත්‍රී |

**01.<u>පසුගිය මස සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම:</u>**

2022 දෙසැම්බර් මාසයට අදාළව 2022.12.28 වන දින පැවති පසු ගිය සභා රැස්වීමේ වාර්තාව 2023.01.11 දින ම'විසින් සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාහට සහ මන්ත්‍රීතුමියන්ලාහට ලබා දී ඇති අතර, එම වාර්තා මෙම සභාවේ කියවූවාසේ සළකා සභා සම්මත කර ගන්නා මෙන් ගරු සභාපතිතුමන් ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදි.

ඒ අනුව 2022.12.28 දිනට අදාළ මාසික සභා රැස්වීම් වාර්තාවට සංශෝධන කිසිවක් ඉදිරිපත් නොකළ හෙයින් සත්‍ය වාර්තා බවට ගරු මන්ත්‍රී කේ.එම්.ජයසුන්දර මැතිතුමන් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ආර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදි. අනතුරුව 2022.12.28 දිනට අදාළ සභා වාර්තාව සත්‍ය වාර්තා බවට ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මත විය

**02.<u>ගරු සභාපතිතුමාගේ (මූලාසනයේ) විශේෂ නිවේදන:</u>**

2023 ජනවාරි මාසයට අදාළව පවත්වන ලද සාමාන්‍ය මාසික සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමන්ගේ කාරුණික ආරාධනය පිළිගෙන පැමිණි ගරු උප සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත් සහා ලේකම්තුමන් ඇතුළු සභාවේ කාර්ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමින් ගරු සභාපතිතුමන් අද දිනයට නියමිත විශේෂ නිවේදන සභාවට ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව වර්තමානය වන විට පළාත් පාලන ආයතන සඳහා මැතිවරණයක් ප්‍රකාශයට පත්කර තිබෙන බවත්, මේ සඳහා විවිධවූ කතිකාවත් රටතුල ඇතිවන අවස්ථාවක් බව ගරු සභාපතිතුමන් මුලින්ම සඳහන් කරන ලදි. මේ වන විට පිළිගත් දේශපාලන පක්ෂ රැසක් මැතිවරණය සඳහා ඇප මුදල් තැම්පත් කර තිබෙන බවත් ජනවාරි මස 21 වන දින වන විට නාම යෝජනා භාරදීම අවසන් කල යුතු බව නිවේදනය කර තිබෙන බව සඳහන් කරන ලදි. එනිසා

රටේ පවතින තත්වය දෙස බලා මැතිවරණය පිළිබදව යහපත් තීන්දුවක් තීරණයක් ගනියි කියා විස්වාසයක් පවතින බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

කෙසේ වෙතත් වර්තමානය වෙද්දී සියළු සංවර්ධන කටයුතු සිදුකරගෙන යන ආකාරයට සිදු කරගෙන යන බවත්, අයවැය වාර්තාවද ගරු මන්ත්‍රී මණ්ඩලයේ කැමැත්ත මත සහා සම්මත කරගෙන තිබෙන බවත්, ඒ අයවැය යෝජනා වලට අනුකූලව දිළිදු ජනතාවගේ ප්‍රශ්න හොදින් හදුනාගනිමින් ඒ අයට යහපතක් වන අකාරයට දේශපාලන මතයකින් තොරව කටයුතු කරමින් පවතින බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

විශේෂයෙන් ළමා උද්‍යානයේ සංවර්ධන කටයුතු සිදුකරමින් පවතින අතර, ඒ සදහා අවශ්‍ය වන්නාවූ උපදෙස් හා උපකරණ ළමාකාර්යාංශය මගින් ලබා ගනිමින් පවතින බවත්, සදහන් කරන ලදි. ඒවාගේම ළමා උද්‍යානයේ සංවර්ධන කටයුතු සදහා මෙන්ම මැදගම නගරයේ සංවර්ධනය කර ඇති සතිපොළ භූමියෙන් කැන්දවින්න මාර්ගයට පිටවීමට හැකිවන පරිදි මාර්ගයක් සකස් කිරීම යෝජනා ලෙස ඉදිරිපත් කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් 2023.01.23 දින පැවැත්වෙන බවත්, එම සාකච්ඡාවෙන් පසු යෝජනා ක්‍රියාත්මක කර ගැනීමට හැකියාවක් පවතියි කියා විස්වාසයක් පවතින බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම ළමා උද්‍යානයේ සියළු ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලැබූයේ ද්‍රව්‍ය පදනම මතයි.කිසිදු ඉදිකිරීමක් සදහා කොන්ත්‍රාත් ලබාදී නොමැති බවත්, ළමා උද්‍යාන භූමිය තුල ගැමි ගෙදරක් නිර්මාණය කරමින් පවතින බවත්, ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. එම ගැමි ගෙදර නිර්මානය කිරීම සදහා පෙදරේරුවන් තුන්දෙනකු, හතර දෙනකු පමණක් වැඩ කර ඇති බවත්,අනෙකුත් සියළු අමු ද්‍රව්‍ය සපයාගත් බවත්, තීන්ත ආලේප කිරීම සදහා පමණක් මුදල් වියදමක් දැරීමට සිදුවූ බවත්, ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. බොහෝදුරට මේ ඉදිකිරීම් සියල්ල සිදුකරන ලද්දේ සභාවේ යම් ගොඩනැගිල්ලකින් ඉවත්කරන අමු ද්‍රව්‍ය රැගෙනවිත් පෙදරේරුවෙක්, වඩු කාර්මිකයකු සම්බන්ධ කරගනිමින් සභාවේ කම්කරුවන් යොදවාගෙන මූලික කටයුතු සිදු කරමින් පවතින බව ප්‍රකාශ කරන ලදි. ලක්ෂ 25 කට වැඩි ප්‍රමාණයක් වටිනාකමකින් යුක්තව සංවර්ධනයක් සිදුකර ඇති බවත්, ඉදිරියේදී භූමිය අවට වැට සකස් කර පස් පුරවා සංවර්ධන කටයුතු නිමා කර මේ මාසය අවසන්වීමට පෙර ප්‍රදේශයේ දුවාදරුවන් වෙනුවෙන් විවෘත්ත කිරීමට බලාපොරොත්තුවෙන් සිටින බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. ළමා උද්‍යානයක් නොමැතිකම නගරයට විශාල අඩුපාඩුවකි. එසේම සමස්ථ නගරයම ගත්කල සභාපතිතුමන්ලා භාරගන්නා විට තිබූ නගරයේ ස්වභාවයට වඩා 100% ක් සංවර්ධනාත්මක නගරයක් නිර්මාණය කර ඇති බවත්, දිවා රාත්‍රී දෙකෙහිම වෙහෙසෙමින් කරන කැපකිරීම් වල ප්‍රතිපල මේවා වන බවත්, සියළුම මූලික පහසුකම් සලසා දී සමස්ථ මැදගම පත්තුවේම සංවර්ධනයක් කිරීමට හැකියාවක් ලැබී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් සතුටට පත්වන බවත්, මේ සියල්ල සභාපතිතුමන් පමණක් කල දේවල් පමනක් නොව සමස්ථ මන්ත්‍රී මණ්ඩලයේම සහයෝගය මේ සදහා ලැබුණ බවත්, ඒ සම්බන්ධයෙන් සියළුම දෙනාට ආඩම්බර වීමට හැකියාවක් පවතින බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

එසේම සභාවක් ලෙස ගරු සභාපතිතුමන්ලාගේ යුතුකම් හා වගකීම් කොටස හැමදාමත් ඉටුකරන බවත්, මේවනවිටත් සමහර වැඩකටයුතු නැවතී තිබෙන්නේ රටේ පවතින තත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙනි. මේ සියල්ල ඉදිරියේ වැඩකටයුතු සිදුකරගෙන යමින් පවතින අතර, මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කැඩී තිබුනද තවමත් එය සකස් කර ගැනීමට නොහැකිවී තිබෙන බවත්, මෙය සකස් කර ගැනීම සදහා LDSP ව්‍යාපෘතිය සදහා යෝජනාවක් ඉදිරිපත් කර තිබේ. එම ව්‍යාපෘතියෙන් මේ සදහා මුදල් ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කර තිබේ. මේ සදහා ලක්ෂ 20 ක පමණ මුදලක් වැයවෙතැයි අපේක්ෂා කරන බවද සදහන් කරන ලදි. ඒවාගේම සභාවේ කැබ්රථය මාස 03 කට වැඩි කාලයක් කැඩී ඇත. එම කැබ්රථය අළුත්වැඩියා කිරීමට ගරාජයට භාරදී ඇති

අතර, කහගොල්ල යන්ත්‍රෝපකරණ ආයතනයේ ඉංජිනේරු මහතුන්ගේ අධීක්ෂණය යටතේ හා බිබිල ඩිපෝවේ ඉංජිනේරු මහතාගේ අධීක්ෂණය යටතේ සිදුවන බවත්,සඳහන් කරන ලදි.

ඒවාගේම ට්‍රැක්ටර් රථයේ පසුගිය කාලයේ ඔයිල් කාන්දුවක් පැවතුණි. එයද සකස් කිරීමට කටයුතු කල බව සඳහන් කරන ලදි. එවන්වූ අත්‍යාවශ්‍ය කටයුතු දිනපතා සිදුකරමින් පවතින බවත්, මේ සියල්ලෙන්ම බලාපොරොත්තු වන්නේ ජනතාවගේ සේවාව හා මෙහෙවරයි. මේ සඳහා පක්ෂයක්, කුලයක්, පාටක් නොබලා දේශපාලන වාසි නොබලා අවශ්‍ය අවස්ථාවට අවශ්‍ය සේවය සභාවක් ලෙස ඉටු කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම සභාව සතු ආදාහනාගාරයේ කටයුතු මේ වන විට බොහොමත්ම යහපත් ආකාරයෙන් පවත්වාගෙන යන බවත්, එසේ පවත්වාගෙන යෑමට විශාල කැපකිරීම් ප්‍රමාණයක් සිදුකිරීමට සිදුවන බවත්, නිරන්තරයෙන් එම ස්ථානයට ගොස් පවතින අඩුපාඩුකම් සොයා බලා එ්වා සකස් කරමින් දෛනික කටයුතු පවත්වාගෙන යෑමට සිදුවන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. මේ කටයුතු සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගය සහය බලාපොරොත්තු වන බව පවසමින්, අද දිනයේ බොහොමත්ම හරවත්වූ සාකච්ඡාවක යෙදී ජනතාවට කලහැකි සේවයක් වේ නම් ඒ වෙනුවෙන් කටයුතු කිරීමට බොහොමත්ම ගෞරවයෙන් යෝජනා කරන ලදි.

එසේම වර්තමානය වනවිට අධික වර්ෂාව හේතුවෙන් සියළුම ග්‍රාමීය මාර්ග සෝදා පාළුවට ලක්වී මඩ රැදී එරෙන තත්වයට පත්ව තිබේ. පසුගිය දිනක 10 කණුව පොල්ගහවෙල මාර්ගය සම්බන්ධව ගැටළුවක් ඇතිවී ඇති බවත්, එම මාර්ගය සකස් කිරීමට ගරු සභාපතිතුමන්ලා විශාල උත්සාහයක් ගත් බවත්, අරගලකරුවන්ගෙන් හා රජයෙන් ඇතිවූ ගැටළු නිසා කොන්ත්‍රාත්කරු මෙම ඉදිකිරීම අත්හැර දමා ගිය බවත්, එසේ නොමැති නම් වසර ගණනාවක් පවතින ආකාරයට උසින් යුතුව ඉතා උසස් මට්ටමින් පාලම නිර්මාණය කිරීමට බලාපොරොත්තුවෙන් සිටියත් එය සිදුකර ගැනීමට නොහැකිවූ බවත්, ගම්මානයේ ජනතාව එකතුවී ප්‍රධාන මාර්ගය අවහිර කරමින් උද්ඝෝෂණයක් පැවැත්වූ බවත්, මේ පිළිබඳව කරුණු සොයා බැලීමට සහා ලේකම්තුමා එම ස්ථානයට ගිය බවත්, ගරු සභාපතිතුමන් පෙන්වාදෙන ලදි. ගරු සභාපතිතුමන් ගම්වාසීන් කැදවා ඔවුන් සමඟ සාකච්ඡා කර පාලම සකස් කිරීමට අවශ්‍ය බට ප්‍රමාණය සභාවෙන් ලබාදී ග්‍රාම සංවර්ධන සමිතිය හා ප්‍රජාමූල සමිතිය එක්ව මුදල් ප්‍රමාණයක් ලබාගෙන පාලම ඉදිකිරිමේ කටයුතු සිදු කිරීමට එකඟතාවය ලබාගත් බවත්, මෙම පාලම ඉදිකිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් මුදලක් ලබාගෙන ඇස්තමේන්තු සකස් කරමින් පවතින බවත්, ඉදිරි මාස කිහිපය ඇතුලත ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට යෝජිතව පවතින බවත් ඒ වනතුරු ජනතාවට මාර්ගය භාවිත කිරීමට හැකිවන පරිදි පාලම සකස් කර ගැනීමට අවශ්‍ය බෝක්කු බට ප්‍රමාණය මේ වන විටත් එම ස්ථානයට ලබාදී ඇති අතර, ජනතාවට පහසුකම් සැලසෙන ආකාරයට ඉතාමත් කඩිනමින් පාලම සකස් කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම සතිපොළේ ගැටළු විශාල ප්‍රමාණයක් පැවතුණි. ගරු සභාපතිතුමන් පොළ භූමිය තුල ගැටුමක් ඇතිවී ආබාධිත තත්වයට පත්ව සිටින කළුගහවාඩිය ප්‍රදේශයේ පදිංචි රෝගියා බැලීමට ගිය බවත්, ප්‍රකාශ කරන ලදි. පහරකෑමට ලක්ව සිටින රෝගියාට ශල්‍ය කර්මයක් සිදු කිරීමට තිබුනද එහි අතුරු ප්‍රතිපලයකින් ඔහු ජීවිත කාලයටම ආබාධිත පුද්ගලයකු බවට පත්වෙයි යන සැකය හා අවධානම හේතුවෙන් ශල්‍යකර්මය කිරීමට පවුලේ අය කැමැත්තක් නොදක්වයි. සභාවක් ලෙස යහපත් අදහසින් යුතුව රුපියල් කෝටි දෙකක පමණ මුදලක් වැය කර සතිපොළ නිර්මානය කල අතර, එම සතිපොළ භූමිය ත්‍රස්තවාදී කණ්ඩායමක් මැදිහත්ව බෙදා ගැනීමට ගිය අවස්ථාවේදී මෙම ගැටුම ඇතිවී තිබෙන බවත්,එය සභාවෙන් කල ක්‍රියාවක් නොවන බවත්, පෙන්වා දෙන ලදි. සතිපොල සාධාරණව බෙදා වෙන් කිරීමට අවස්ථා කිහිපයක් උත්සාහ ගත් බවත්, සභාවේ රැස්වීමක් පැවැත්වූ අවස්ථාවේ බීමත්ව පැමිණ, විවිධ දේශපාලන කල්ලි කණ්ඩායම් වල මතයන් හේතුකරගෙන එම රැස්වීමද කඩාකප්පල් කල බව ප්‍රකාශ කරන ලදි.එබැවින්

ඉදිරියේදී නීති මාර්ගයට හෝ ගොස් බොහොම සාධාරණව පොළ බෙදා වෙන් කර දීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි.

වර්තමානය වෙද්දී සතිපොළ භූමියේ කොටස් කිහිපයක් අල්ලා ගත් පිරිස්ද සිටියි. ඒහේතුවෙන් මෙන්ම දින 07 ම පොළේ ව්‍යාපාර කරන පුද්ගලයින් සිටින නිසා පොළට පාඩුවක් නොවන බවත්, සභාපතිතුමන්ගේ බලාපොරොත්තුව වූයේ එය වන බවත්, ජනතාවට සහනයක් සැලසෙන ආකාරයට භාණ්ඩ මිලදී ගැනීමට අවස්ථාව ලබාදීම වන බවත්, පවසන ගරු සභාපතිතුමන් ව්‍යාපාරිකයින්ගේ පහසුව උදෙසා කැන්දවින්න මාර්ගයට පොළ භූමියෙන් මාර්ගයක්ද සකස් කර දී ඉදිරිපස ගොඩනැගිල්ල ඉවත් කර ගත් පසු ව්‍යාපාරිකයින් තවත් උනන්දුවෙන් වැඩ කරයි කියා විස්වාසයක් පවතින බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

එසේම මේ වන විට මස්කඩ හා මාළු කඩ සදහා නව ගොඩනැගිල්ලක් ඉදිකර අවසන් කර ඇති අතර, ඒ සදහා විදුලිය සම්බන්ධතාවය ලබාදීමට වයරින් කර ගැනීමට සිදුවූ බවත්, එම ව්‍යාපාරිකයින්ද අදාළ කඩකාමරවල ව්‍යාපාර කටයුතු සිදු කිරීම ආරම්භ කල පසු නගරයේ කටයුතු බොහොමත්ම සාර්ථක වෙයි කියා විස්වාස කරන බව සදහන් කරන ලදි. කෙසේ වෙතත් මෙම කටයුතු සදහා සභාවක් ලෙස මැදිහත්වී යහපත් චේතනාවෙන් යුතුව සුදුස්සාට සුදුසු දේ ලබාදීමට කටයුතු කිරීමට බොහොමත්ම ගෞරවයෙන් යෝජනා කරමින් අද දිනයට නියමිත විශේෂ නිවේද ඉදිරි පත් කිරීම ගරු සභාපතිතුමන් විසින් අවසන් කරන ලදි.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ/පෙත්සම්/පැමිණිලි හා සංනිවේදන:-

### 03.01. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023 පළාත් පාලන ආයතන සතු රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම.

2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපළ මැතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැලැක්වීම සහ ඡන්ද විමසීම පැවැත්වෙන පළාත්වලට අදාළ නිලධාරීන් ,සේවකයන් බඳවා ගැනීම,උසස් කිරීම,මාරු කිරීම සීමා කිරීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක EC/EDR/LAE/2023/04B හා 2023.01.05 දිනැති චක්‍රලේඛ අංක 20 කෙරෙහි හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ අංක 2313/32 දරන හා 2023.01.04 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය කෙරෙහි අවධානය යොමු කර කටයුතු කරන ලෙස දන්වමින් මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවේ දැනගැනීම පිනිස ඉදිරිපත් කරන ලදි.

### 03.02.පාරක් පිලිසකර කර ගැනීමට කරන ඉල්ලීම.

මැදගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති කෝන්ගොල්ල වසමේ හෙල අරාව යායට අයිති දෙහිගහ ඉර කුඹුරට වාහනයක් ගැනීමට පාරක් නොමැති බව ඔබතුමාට දන්වා සිටිමි.මැදගම නගරයේ සිට කොටබෝවට යන ප්‍රධාන මාර්ගයේ පැමිණ 03 කණුව හරහා කෝන්ගොල්ලට යන අතුරු මාර්ගය පැමිණ කුඹුර අසලටම පැමිණීමට හැකිබව දන්වා සිටිමි.එම මාර්ගයේ සමහර ස්ථාන ඉඩම් හිමිකරුවන් අවහිර කර තිබෙන බවත්,අදාළ මාර්ගයේ අවසානයේ කුඹුරු යාය පිහිටා තිබෙන අතර, එම අවසාන කොටසේ විශාල වලක් සෑදී අබලන් තත්වයට පත්ව තිබේ.එබැවින් එම වල පුරවා මාර්ගය සකස් කර දෙන ලෙසට ඉල්ලමින් තිලක් සෙවන,දියකොලේයාය,බදුල්ලගම්මන ලිපිනයේ පදිංචි ඒ.එම්.තිලකරත්න මහතා විසින් ගරු සභාපතිතුමන් වෙත යොමු කර ඇති ලිපිය සභාවේ දැනගැනීම පිනිස ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදි.

### 03.03.රබර් මිල පහත වැටීම සම්බන්ධවයි.

වර්තමානය වන විට වෙළඳ පොළ තුල උද්ගතව ඇති රබර් මිල පහත වැටීමේ ගැටළුව සහ දේශීය රබර් අලෙවි කර ගැනීමේ ගැටලුව පිළිබඳව ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන්ගේ සහ අමාත්‍යාංශ නිලධාරීන්ගේ අවධානය යොමු වී ඇත. ඒ අනුව මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශයේදී

පැවති සාකච්ඡාවකදී තීරණය කල පරිදි දේශීයව නිපදවන රබර් සහ ආනයනික රබර් සඳහා වන ඉල්ලුම විධිමත් කිරීම සඳහා මෙම අමාත්‍යාංශ ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත්කර ඇති බවත්, එම කමිටුවේ නිර්දේශයන් මත ඉහත ගැටළු නිරාකරණය කිරීම සම්බන්ධයෙන් ගතයුතු පහත ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැනුවත් කිරීම.

01.කර්මාන්ත අංශය සමග වෙළෙඳුන් හා ගොවීන් සම්බන්ධීකරණය කිරීම මගින් වොළඳ පොළ තුළ අළෙවි නොවී පවතින රබර් තොග අලෙවිය කාර්යක්ෂම කිරීම.

02.ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දේශීය රබර් මිලදී ගැනීම සඳහා කර්මාන්තකරුවන් දිරිමත් කිරීම.

03.කොළඹ රබර් වෙළෙඳුන්ගේ සංගමය හරහා තරව දුරටත් අමු රබර් අපනයනය ප්‍රවර්ධනය කිරීමට ඇති හැකියාව සොයා බැලීම.

**<u>03.04.සමිති ශාලා ගොඩනැගිල්ල ඉදිකර ගැනීම</u>**

2022.01.03 වන දින සභාතිතුමන්ගේ ප්‍රධානත්වය ඇතිව මුල්ගල තබා ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද සමිති ශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම කටයුතු තරමක් දුරට සිදුකර ඇති අතර, පවතින ආර්ථිකමය ගැටළු හේතුවෙන් සමිතියේ සාමාජික සාමාජිකාවන්ගෙන් මේ සඳහා උපකාර ලබාගැනීම ගැටළුවක් වී ඇත.එබැවින් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අවශ්‍ය සිමෙන්ති මළු ගරු සභාපතිතුමන්ට හැකියාව තිබෙන්නේ නම් ලබා දෙන මෙන් ඉල්ලීම් කර ඇති තිසර අවමංගල්‍යාධාර සමිතියේ ලිපිය ගරු සභාපතිතමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

**<u>03.05.මාර්ගය ප්‍රතිසංස්කරණය කර ගැනීම සම්බන්ධවයි.</u>**

ගල්ගේ මුල්ල එගොඩ කනත්ත වන අපගේ මාර්ගය මේ වන විට වතුර බැස යන කාණුවක් බවට පත්ව ඇත. හදිසි අවස්ථාවක දී වාහනයක්වත් ගැනීමට නොහැක.කලක් තිස්සේ අබලන්ව පවතින මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කරදෙනමෙන් ඉල්ලමින් ගැටදොඩම්ගහ වත්ත,කින්නරබෝව, මැදගම ලිපිනයේ පදිංචි පී.ඒ.නුවන් කිත්සිරි මහතා විසින් සභාපත්තුමන් වෙත යොමු කර ඇති ලිපිය සභාවේ දැනගැනීම පිනිස ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදි.

<u>බන්දුල මන්ත්‍රීතුමා හා අශෝක මන්ත්‍රීතුමා</u>

පසුගිය වර සභාවේ මාර්ගය සකස් කිරීමට අනුමතවී තිබේ. නමුත් කිසිදු කාර්යය ඉටුවී නොමැත. විමසීමක් කරන ලදි.

<u>පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා</u>

මාර්ගය සකස් කිරීමට කවුරුන් හෝ භාර ගතයුතුවේ. පන්සලේ ස්වාමීන්වහන්සේටද මේ බව දැනුම් දුන් බව සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. සිමෙන්ත් ප්‍රමාණය , ගල් හා අනෙකුත් අමුද්‍රව්‍ය ලබාදීමට හැකියාව පවතියි. අවශ්‍ය වැලි සපයාගෙන මාර්ගය සකස් කර ගන්නා ලෙසට පන්සලේ ස්වාමීන්වහන්සේටද පැවසුවත් කිසිවෙකුත් ඉදිරිපත් නොවූ බව ප්‍රකාශ කරන ලදි. එනිසා මේ සඳහා නිමල් මන්ත්‍රීතුමන්ලා හෝ මැදිහත්ව පාර ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේ නම් ගල්, සිමෙන්ති හා කම්කරුවන් කිහිප දෙනකු සභාවෙන් ලබාදීමට හැකියාව තිබෙන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

වර්තමානය වන විට සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ගිවිසුම් අත්සන් කිරිමට හැකියාවක් නොපවතියි. එනිසා අවශ්‍ය සිමෙන්ති ප්‍රමාණය ලබාදීමට හැකියාව තිබේ.වගකීම මන්ත්‍රීතුමන්ලා භාරගෙන ඒ වැඩකටයුතු සිදු කර ගන්නා ලෙසට දැනුම් දෙන ලදි.

**<u>03.06.කරමැටිය කසල අංගනයට යන මාර්ගය සකස් කිරීම</u>**

කරමැටිය කසල අංගනයට කසල ගෙන යන මාර්ගය කොන්ක්‍රීට් තට්ටුව ගැලවී ගොස් බොහොමත්ම අබලන් තත්වයට පත්ව තිබේ. ට්‍රැක්ටර් ගෙන යන විට ඒවා පෙරලී යන මට්ටමට පවතියි. මාර්ගය සකස් කරන විට දින කිහිපයක් වසා දැමීමට සිදුවන නිසා විකල්ප මාර්ගයක් සකස් කරමින් පවතින බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

නිමල් මන්ත්‍රීතුමා
තිඹිරිය ගම්මානයට හා පන්සලට යන මාර්ගය කැඩී අබලන් තත්වයට පත්ව තිබේ. එය කඩිනමින් ප්‍රතිසංස්කරණය කල යුතු වන බව ප්‍රකාශ කරන ලදි.

**03.07.තිඹිරිය මිල්ලගොල්ල පාර පිළිසකර කර ගැනීම පිණිස**

තිඹිරිය මිල්ලගොල්ල මාර්ගයේ කොටසක් දැඩිසේ අබලන් වී ඇති බැවින් එම කොටසේ දැනට වාහනයක් පවා ගෙන යෑමට අපහසු බැවින් එම කොටස පිළිසකර කරදෙන ලෙසට ඉල්ලා මිල්ලගොල්ල වත්ත, තිඹිරිය,මැදගම ලිපිනයේ පදිංචි ආර්.එම් ජයසේකර මහතා ඇතුළු මාර්ගය භාවිත කරන පිරිසක් විසින් යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවේ දැනගැනීම පිනිස ඉදිරිපත් කරන ලදි.

**03.08.ජපන් රජයේ මූල්‍ය හා තාක්ෂණික දායකත්වය මත (JICA) ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත පළාත් පාලන ආයතනවල ග්‍රාමීය ජල යෝජනා ක්‍රම තිරසාරව කළමනාකරණය කිරීම සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.**

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් වසර දෙක හමාරක කාල සීමාවක් තුල ක්‍රියාත්මක කරනු ලබන ජපාන රජයේ (JICA) මූල්‍ය හා තාක්ෂණික දායකත්වය ඇතිව ඉහත සඳහන් වැඩසටහන 2022 ක් වූ ජුනි මස ආරම්භ කරන ලද බවත්,

02. ඒ අනුව පළාත් පාලන ආයතන 24 ක් පාදක කර ගනිමින් සිදු කරනු ලබන මූලික සමීක්ෂණ වාර්තාවලට අනුව අප පළාත් පාලන ආයතනය මෙම ව්‍යාපෘතිය සඳහා යෝජනාවී ඇති බව සතුටින් දන්වා ඇත.අප පළාත් පාලන ආයතනය විසින් නඩත්තු කරනු ලබන ජල ව්‍යාපෘති ඉදිරියේදී ජාතික ජල සම්පාදන මණ්ඩලයට පවරා දීමට අදහස් කන්නේ නම් ඒ පිළිබඳවත්, එසේම ජල ව්‍යාපෘති පවරා දීමට අදහස් නොකරන්නේ නම් ඒ පිළිබඳවත් 2023.01.20 දින පෙර පළාත් පාලන කොමසාරිස්තුමන්වෙත දන්වන ලෙස දන්වා ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමන් විසින් යොමු කර ඇති ලිපිය සභාවේ දැනගැනීම පිණිස ගරු සභාපතිතුමන් ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමා
ජල යෝජනා ක්‍රමය ජාතික ජල සම්පාදන මණ්ඩලයට පැවරීමට කැමැත්ත ප්‍රකාශ කරන්නේ නම් ඒ පිළිදව දැනුම් දෙන ලෙසට දන්වා තිබේ.ජල සම්පාදන මණ්ඩලය පැවරුවහොත් අධික ජල බිලක් ගෙවීමට සිදුවේ.

ෂබ්රි මන්ත්‍රීතුමා
ජල සම්පාදන මණ්ඩලයට පැවරීම පාඩුවකි. එයින් ජනතාවටද අසධාරණයක් සිදුවේ.

ගරු සභාපතිතුමා
ජල සම්පාදන මණ්ඩලයෙන් ජලය ලබා ගැනීමට රු.35000.00 ක පමණ මුදලක් වැයවේ. නමුත් සභාවේ ජල යෝජනා ක්‍රමයෙන් ජලය ලබා ගැනීමට වැය වන්නේ රු. 5000.00 ක මුදලකි. මෙම ජල යෝජනා ක්‍රමයෙ අධික වර්ෂාවක් ඇතිවූ විට ජල නල පද්ධතියට කොළ රොඩු පස් එකතුවේ. එනිසා දෙපසින් සකස් කර ඇති පැති බැම්ම උස් කර සකස් කිරීමට සිදුවේ.එය සකස් කර ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා මුදල් ලැබුනහොත් සකස් කරගැනීමට හැකියාව පවතියි. ජලය ලබා ගැනීමට වියදමක්ද දැරීමට සිදු නොවීම තවත් වාසියකි.

අශෝක මන්ත්‍රීතුමා
ජල යෝජනා ක්‍රමය දීර්ග කිරීමටද හැකියාව පවතින බව සඳහන් කරන ලදි.

ඒ අනුව මේ සම්බන්ධයෙන් දීර්ග ලෙස සාකච්ඡා කල සභාව අමුණේකදුර ජල යෝජනා ක්‍රමය සභාවට පැවරීම තුලින් ජනතාවට ජලය ලබා ගැනීමටත්, ජල සම්බන්ධතාවය ලබා ගැනීමටත් විශාල වියදමක් දැරීමට සිදුවේ. එය ජල යෝජනා ක්‍රමය භාවිතයට ගන්නා ජල පාරිභෝගිකයින්හට සිදුවන විශාල අසාධාරණයක් වන බැවින් ජල යෝජනා ක්‍රමය ජාතික ජල සම්පාදන මණ්ඩලයට පවරා නොදීමට ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත තීරණයක් ගන්නා ලදි.

**04. <u>යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න : - නැත</u>**

**05. <u>යථා පරිදි කල්දී ඇති යෝජනා</u> :-**

**<u>05.01.යෝජනාකරු:- ගරු සභාපති - රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව : - නගර සීමාව තුල අනවසරයෙන් මාළු විකිණීම තහනම් යනුවෙන් සඳහන්වූ නාම පුවරු සකස් කිරීම.</u>**

මැදගම නගරයේ සතිපොළ භූමිය තුල මාළු කඩ 03 ක් පවතින අතර, එම මාළු කඩ දෙකම 2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදනයෙන් බදු ගෙන තිබේ. එසේ බදුගත් මාළු කඩ තුනක් තිබියදී නගරයේ ස්ථාන කිහිපයකම මාළු විකිණීම සිදුකරන බව නිරීක්ෂණය විය. එසේ මාළු විකිණීම තුලින් සිදුවන්නේ නගරයේ මාළු කඩ ව්‍යාපාරිකයින්ගේ ආදායමක් අහිමි වීමකි. එබැවින් සභාවක් ලෙස මේ සඳහා විසඳුමක් වශයෙන් මාළු විකිණීම තහනම් කර නාම පුවරු සවි කිරීමට තීරණය කරන ලදි. එම නාම පුවරුසවි කිරීමට නාම පුවරු සකස් කිරීම සුදුසු වන බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ඒ.එම්.ප්‍රේමපාල මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර,යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය විවිධවූ අදහස් ඉදිරිපත් කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

එක් නාම පුවරුවක් සඳහා 15000.00 කට ආසන්න මුදලක් මිල ගණන් යටතේ ඉදිරිපත් කර තිබේ.

<u>නිමල් මන්ත්‍රීතුමා</u>

නාම පුවරුව සඳහා ඉදිරිපත් කර ඇති මිල සාධාරණවේ. නාම පුවරු කීයක් සකස් කරන්නේද? නගර සීමාව තුල සවි කලහොත් නාම 05 ක් සවි කිරීමට සිදුවේ.

<u>ගරු සභාපතිතුමා</u>

බිබිල සභාවේ නාම පුවරු සකස් කර ඇති ආකාරයට සකස් කිරීමට සැලසුම් කර තිබෙන බව ප්‍රකාශ කරන ලදි. මෙය වසර 20 කට වැඩි කාලයක් පවතින බවට සහතිකයක් ලබාදෙයි.

<u>කෝකිල මන්ත්‍රීතුමා</u>

නාම පුවරුවේ ප්‍රමාණය අඩු කර සකස් කරමු.

<u>බන්දුල මන්ත්‍රීතුමා</u>

සීමාව සංකේතවත් වන ආකාරයේ පුවරුවක් සකස් කර සවි කරමු. විශාල පුවරුවක් අවශ්‍ය නොවේ.

<u>කෝකිල මන්ත්‍රීතුමා</u>

විශාල මුදලක් වැය කර බෝඩ් සවිකලාට ප්‍රයෝජනයක් නොවේ.මිනිසුන් ඒවා විනාශයට පත් කරයි.

<u>ගරු සභාපතිතුමා</u>

මිල ගණන් ඉදිරිපත් කර ඇති ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයට නාම පුවරු සවි කිරීමට සුදුසු දැයි විමසීමක් කරන ලදි. මාළු විකිණීම බයිසිකල් වලින් යන පුද්ගලයින් නම් දිගටම සිදු කරයි.

නමුත් සමහර පුද්ගලයින් මඩු සකසා ගෙන දීර්ග කාලීනව මාළු අලෙවි කිරීමේ කටයුතු සිදු කරයි. එම ව්‍යාපාර වලකා ගැනීමට මෙම පුවරු සවි කරන බව පෙන්වාදෙන ලදි.

<u>ෂබ්රි මන්ත්‍රීතුමා</u>

මාළු විකිණීම මඩු සකස් කර සිදුකල නොහැකියි. බයිසිකලයෙන් විකිණීම් කටයුතු සිදු කරයි නම් ගැටළුවක් නොවේ.නගරය තුල විකිණීම තහනම් කර නීතයක් ගෙන ආයුතු බව ප්‍රකාශ කරන ලදි. සභාපතිතුමන්ලාට හැකියාව තිබේ නම් බයිසිකල් වලින් මාළු විකුණන පුද්ගලයින් සිටී නම් ඔවුන්ද ලියාපදිංචි කිරීමට කටයුතු කරන්න.

ඒ අනුව උක්ත යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව වර්තමානයේ සභාවේ ඇති ආදායම් මට්ටමද සලකා බලා සකස් කරන නාම පුවරු ඉතා විශාල ප්‍රමාණයෙන් නොව කුඩා ප්‍රමාණයට අවශ්‍යම කරුණු පමනක් සදහන් කර මිල ගණන් ඉදිරිපත් කර ඇති වර්ග ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයකින් සකස් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික තීරණය විය.

**<u>05.02.යෝජනාකරු :- ගරු සභාපති - රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව : - LL – 7605 කෘ කැබ් රථය සදහා අමතර කොටස් යෙදීම හා කුෂන් යොදා අසුන් සකස් කර අළුත්වැඩියා කිරීම.</u>**

මැදගම ප්‍රාදේශීය සභාව සතු කම්කරු මහතුන් හා භාණ්ඩ ප්‍රවාහනය කරන LL – 7605 කෘ කැබ් රථයේ දකුණු පස ටයර් රෝඩ් යෙදීම, පිටුපස හා ඉදිරිපස අසුන් කුෂන් කර කාපට් ඇතිරීම යන අළුත්වැඩියා කටයුතු සිදුකර කෘ කැබ්රථය සකස් කලයුතුව පවතින අතර, අදාළ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථීරත්වය :- ගරු මන්ත්‍රී - ආර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය.

**<u>05.03.යෝජනාකරු:- ගරු උප සභාපති - ආර්.එම්.කේ.බිමල් රත්නායක මැතිතුමා</u>**

<u>යෝජනාව:- මැදගම නව සතිපොළ භූමිය ආවරණය වන පරිදි CCTV කැමරා පද්ධතියක් සවි කිරීම.</u>

මැදගම නව සතිපොළ භූමියේ ව්‍යාපාරික කටයුතු කරන වෙළෙඳුන්ගේ වෙළඳ කුටි රාත්‍රී කාලයේදී ආරක්ෂා කර ගැනීම හා සතිපොළ භූමියේ ආරක්ෂාව වෙනුවෙන් CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කරදෙන මෙන් සතිපොළ ව්‍යාපාර කටයුතු වල නිරත ව්‍යාපාරිකයන් පිරිසක් මාගෙන් ඉල්ලීම් කර තිබේ. (අදාළ ලිපිය මේ සමඟ ඉදිරිපත් කරමි)

එබැවින් මෙම නව සතිපොළ භූමියේ CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීම තුලින් සතිපොළ භූමිය පමනක් නොව සතිපොළ අවට සභාව සතු නිශ්චල දේපල වල ආරක්ෂාව තහවුරු කර ගතහැකිවේ. එබැවින් ඒ වෙනුවෙන් මෙම ස්ථානයේ කැමරා පද්ධතියක් සවිකිරීම සුදුසු යැයි මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

<u>නිමල් මන්ත්‍රීතුමා</u>

සභාවෙන් එසේ කැමරා පද්ධතියක් සවි කිරීමට හැකියාවක් පවතින්නේද විමසීමක් කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

දැනටමත් කැමරා දෙකක් සවිකර තිබෙනවා.සමස්ථ නගරයම ආවරණය වන ලෙස කැමරා සවි කල හැකි නම් ඉතාමත් වටින බව ප්‍රකාශ කරන ගරු සභාපතිතුමන් මේ සදහා විශාල මුදලක් වැය වේ. එනිසා සභාවේ ආර්ථික තත්වය සලකා බලා ඉදිරියේදී සිදුකිරීමට සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව උක්ත යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව වර්තමානයේ සභාවේ පවතින ආර්ථික තත්වය සලකා බලා cctv කැමරා පද්ධතිය සවි කිරීමට හැකියාවක් පවතින්නේ

නම් කැමරා පද්ධතිය සවි කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී මණ්ඩලය ඒකමතිකව තීරණය කරන ලදි. උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මන්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවිය

**<u>05.04.යෝජනාකරු:- ගරු සභාපති - රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව :- පාලම් තරාදියක් ඉදිකිරීම සඳහා බිම් කොටසක් ලබා දීම.</u>**

මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොවි මහතුන්ගේ කෘෂි නිශ්පාදන අලෙවි කිරීමේදී එම නිශ්පාදන නිසිලෙස කිරාමැන ගැනීම සදහා පාලම් තරාදියක අවශ්‍යතාවය දැඩි ලෙස පවතියි. වර්තමානය වන විට ගොවි ජනතාව අදාල කිරුම්නුම් කටයුතු සිදු කරගනු ලබන්නේ දුරබැහැර ප්‍රදේශවලිනි. ඒ සදහා ඔවුන්ට අමතර වියදමක් දැරීමට සිදුවේ. එබැවින් මේ කරුණු සැලකිල්ලට ගෙන පාලම් තරාදියක් ඉදිකිරීමට කදුරට මාර්කටින් සර්විස් ආයතනය කැමැත්ත ප්‍රකාශ කර දිග මීටර් 14 ක් හා පළල මීටර් 5 ක බිම් කොටසක් ලබාදෙන ලෙසට අපගෙන් ඉල්ලීමක් කර ඇති අතර, ඒ සදහා ආදාහනාගාර භූමියෙන් බිම් කොටසක් ලබාදී එම බිම් කොටස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබාගෙන එම තක්සේරු මුදලට වසර 03 ක කාලයක් සදහා බදු ගෙවීමේ පදනම මත තරාදිය ඉදිකිරීමට බිම් කොටසක් ලබාදීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ජී.එච්.කෝකිල රුෂාන් කුමාර මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය විවිධ වූ අදහස් ඉදිරිපත් කරන ලදි.

<u>ෂබ්රි මන්ත්‍රීතුමා</u>

බිම් තරාදිය මැදගම නගරයට අත්‍යාවශ්‍යම කරුණකි පාලම් තරාදියක් ඉදිකර ගැනීම. පාලම් තරාදිය ඉදිකර සභාවට මුදලක් ලැබෙන ආකාරයට සකස් කර ගත යුතු බව ප්‍රකාශ කරන ලදි.

<u>නිමල් මන්ත්‍රීතුමා</u>

පාලම් තරාදිය ඉදිකිරීමට බලාපොරොත්තු වන්නේ කුමන ස්ථානයකද? විමසීමක් කරන ලදි.

<u>කෝකිල මන්ත්‍රීතුමා</u>

පාලම් තරාදිය ඉදිකිරීමට බිම් කොටසක් ඉල්ලන්නේ පෞද්ගලික ඉඩමකින්ද එසේ නොමැති නම් සභාවේ ඉඩමකින්ද?

<u>ගරු සභාපතිතුමා</u>

සභාව සතු ඉඩමකින් කොටසක් ලබාදෙන ලෙසට ඉල්ලීම් කර තිබේ.

<u>බන්දුල මන්ත්‍රීතුමා</u>

තරාදිය ඉදි කරන්නේ කවුරුන්දැයි විමසීමක් කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

කදුරට මාර්කටින් සර්විස් නම්වූ පුදග්ලික ආයතනයක් ඉල්ලීමක් කර තිබේ. මෙම ආයතනයට බිම් කොටසක් ලබා දෙන්නේ නම් අදාළ බිම් කොටස තක්සේරු කර ගිවිසුමක් අත්සන් කර ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියද ලබාගෙන සිදු කල යුතු වන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

<u>නිමල් මන්ත්‍රීතුමා සහ බන්දුල මන්ත්‍රීතුමා</u>

අයකිරීම් කරනුයේ මාසික අය කිරීමක් වශයෙන්ද විමසීමක් කරන ලදි.

<u>ගරු සභාපතිතුමා</u>

තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කැදවා තක්සේරුවක් මුලින්ම සිදුකර ගතයුතුවේ.ඒ අනුව අයකිරීම වසර 03 කට,04 කට හෝ 05 කට ලබාදීමට හැකියාව පවතියි.

<u>ෂබ්රි මන්ත්‍රීතුමා</u>

වසර 03 තුනකට හෝ 04 කට ලබාදී ගිවිසුම් කාලය අවසන් වූ පසු එය සභාවට පවරා ගත යුතුයි.

ගරු සභාපතිතුමා

තරාදිය ඉදිකිරීමට බිම් කෙටසක් ලබා දෙන්නේ නම් එම බිම් කොටසද තක්සේරු කර ලබාදීමට සිදුවේ. ගිවිසුම් කාලය අවසන් වුවත් තරාදිය සභාවට ලබා දීමට ඔවුන් කටයුතු නොකරයි. තරාදිය ඉදිකිරීම සදහා බිම් කොටසක් ලබා දෙන්නේ නම් ජල සම්පාදන මණ්ඩලයට හා ටෙලිකොම් ආයතනයට ලබාදී ඇති අකාරයට බිම් කොටස මැනීම් කටයුතු සිදු කර සැලැස්මක් ඇද අවසන් කල පසු තක්සේරු දෙපාර්තමෙන්තුවෙන් තක්සේරුවක් ලබාගෙන ඔවුන් බොහෝ අවස්ථාවලට වාර්ෂික වටිනාකමක් ලබා දෙයි. එම වර්ෂික වටිනාකමට බිම් කොටස ලබාදීමට ගරු ආණ්ඩුකාරතුමන්ට යොමු කර අනුමැතියක් ලබාගත යුතුවේ. මෙය සභාවට අත්‍යාවශ්‍ය කරුණක් වන්නේ නම් සභාවේ යෝජනා සම්මත කර ආණ්ඩුකාරතුමන්ට ඉදිරිපත් කරමු. තරාදිය ඉදිකිරීම සදහා ආදාහනාගාර භූමියේ රථවාහන අංගනය ඉදිකර ඇති භූමියෙන් බිම් කොටසක් ලබාදීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි.

නිමල් මන්ත්‍රීතුමා

නගර සීමාව තුල ඉඩම් කොටසක් ලබාදීමට හැකියාවක් නොපවතියිද ?

බන්දුල මන්ත්‍රීතුමා

පාලම් තරාදිය ඉදි කිරීමට බලාපොරොත්තු වන්නේ කුමන ස්ථානයකද ?

ගරු සභාපතිතුමා

ආහාහනාගාර භූමියේ උඩ කොටසේ බිම් කොටසක් පවතියි. එම ස්ථානයේ රථවාහන අංගනය හා ගරාජයක් සකස් කිරීමට වෙන් කර තිබේ. පසුගිය දිනක අපේ වාහනයක් විගණන නිලධාරීන් රැගෙන ඒමට ගොස් මොණරාගලදී විශාල අනතුරක් සිදුවීමට ගොස් එම අනතුරින් බේරුණ බව පෙන්වාදෙන ලදි. රථවාහන අංගනයක් හා ගරාජයක් සකස් කිරීමට අයවැය යෝජනා කිහිපයකට ඉදිරිපත් කලත් එය සකස් කර ගැනීමට නොහැකිවූ බව පෙන්වාදෙන ලදි.

වර්තමානය වන විට කිසිදු කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමට හැකියාවක් නොපවතියි. සියළු ඉදිකිරීම් කටයුතු සිදු කරනුයේ සභාව මගින් කම්කරුවන් හා පුහුණු කම්කරුවන් යොදවාගෙන සංවර්ධන කටයුතු සිදුකරයි. එනිසා එවන් වගකීමක් භාර ගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවෙයි. වගකීමක් භාර ගතහොත් එම ස්ථානයේම රැදී අදාළ කටයුතු සිදු කිරීමට සිදුවේ. පසුගිය කාලයේ සංවර්ධන කටයුතු සිදු කලේ ඒ ආකාරයට බව ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව උක්ත යෝජනාව සම්බන්ධයෙන් දීර්ග ලෙස සාකච්ඡා කල සභාව මැදගම ප්‍රදේශයට විශාල අඩුවක්ව පවතින පාලම් තරාදියක් ඉදි කිරීම ඉතාමත් කාලෝචිත යෝජනාවක් වන බව පවසමින් යෝජනාව සදහා ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පල කල බැවින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මත වීය.

**05.05.යෝජනාකරු:- ගරු සභාපති - රංජිත් පියදිගම මැතිතුමා**

**යෝජනාව :- නියමිත දිනට රාජකාරියට නොපැමිණෙන සේවකයින්ගේ නිවාඩු දිනයක් සදහා දින දෙකක වැටුප කපහැරීම.**

පළාත් පාලන සේවයේ සෞඛ්‍ය සේවාව යනු අත්‍යාවශ්‍ය සේවාවක් වන අතර, සභාවෙන් සිදුකරන දෛනික රාජකාරි කටයුතු වලින් සෞඛ්‍ය අංශයේ කටයුතු අත්‍යාවශ්‍ය කටයුත්තක් බවට පත්කර තිබේ. කසල එක්රැස් කිරීම පොදු ස්ථාන පිරිසිදු කිරීම, නගරය පිරිසිදු කිරීම ආදී කටයුතු දෛනිකව සභාවෙන් කලයුතු කාර්යයන්වේ. සෑම සතියකම සෙනසුරාදා හා සදුදා දිනයන්හි තොග පොළ හා සිල්ලර පොළ පැවැත්වෙන අතර, පොළ පැවැත්වීමෙන් අනතුරුව ආදාල ස්ථානය පිරිසිදු කිරීමේ කටයුතු සිදුකරණුයේ සෞඛ්‍ය කම්කරුවන් විසිනි. එසේ පිරිසිදු කිරීම් කටයුතු සිදු කිරීමේදී සෞඛ්‍ය කම්කරුවන් සේවය නොපැමිණීම මහත් ගැටළුවක් බවට පත්ව තිබේ.ඔවුන් අදාළ දිනයට සේවයට පැමිණීම මගහරිමින් සිටියි. එනිසා මේ සදහා විසදුමක් ලෙස කම්කරුවෙකු රාජකාරි ආවරණය

සඳහා තවත් කම්කරුවෙකු නොයොදවා නිවාඩු අනුමත නොකර නිවාඩු ලබයි නම් එම නිවාඩු ලබන එක් දිනයක් වෙනුවෙන් දින දෙකක වැටුප කපා හැරීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලද හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය.

**<u>05.06.යෝජනාකරු:- ගරු සභාපති - රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව :- පුස්තකාලය අයදුම් පත්‍රය අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම</u>**.

මහජන පුස්තකාලයන්හි සාමාජිකත්වය ලබා ගැනීම සඳහා වන සාමාජික අයදුම් පත්‍රය අදාළ පුස්තකාලයන්ට ආවේනිකවූ ආකාරයට සකස් කරගෙන සාමාජිකයන් බඳවා ගනු ලබයි. එම අයදුම් පත්‍රයේ යම් යම් අඩුපාඩුකම් පවතින බැවින් ඒ සඳහා පිලියමක් වශයෙන් මොණරාගල දිස්ත්‍රික්කයේ සියළුම පුස්තකාලයන්ට පොදුවූ අයදුම් පත්‍රයක් මොණරාගල සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් සකස් කර ඇති අතර, අදාළ අයදුම් පත්‍රය සභාවට ඉදිරිපත් කර සභාවේ අනුමැතිය ලබා ගතයුතු පවතින බැවින්, සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් සකස් අකර ඇති අයදුම් පත්‍රය භාවිත කර සාමාජිකයින් බඳවා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුම

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනා සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, ගරු සභාපති ඉදිරිපත් කල යෝජනාවට අනුව පුස්තකාල පොදු ආකෘතිය භාවිත කර සාමාජිකයන් බඳවා ගැනීම සුදුසුවන බව පවසමින් යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය විරුද්ධත්වය ප්‍රකාශ නොකර එකඟත්වය පළ කරන ලදි. උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මතවීය

**<u>05.07.යෝජනාකරු:- ගරු සභාපති - රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව :- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තියේ විධි විධාන ප්‍රකාර කාරක සභා පිහිටුවීම</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තියේ විධි විධාන ප්‍රකාරව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව පිහිටුවිය යුතු බැවින්, ඒ සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කාරක සභාව පිහිටුවීම සුදුසු බවට මම මේ සභාවට යෝජනා කරමි.

**(1) <u>මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව:</u>**

| | | |
|---|---|---|
| I. | ගරු සභාපති රංජිත් පියදිගම මැතිතුමා | - සභාපති |
| II. | ගරු මන්ත්‍රී ඒ.එම්.ප්‍රේමපාල මැතිතුමා | - සාමාජික |
| III. | ගරු මන්ත්‍රී ඒ.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමා | - සාමාජික |
| IV. | ගරු මන්ත්‍රී පී.එම්.අමරපාල මැතිතුමා | - සාමාජික |
| V. | ගරු මන්ත්‍රී කේ.එම්.ජයසුන්දර මැතිතුමා | - සාමාජික |
| VI. | සී.එම්.පුංචි බණ්ඩා මැතිතුමා,14 කණුව,බකිණිගහවෙල | - සාමාජික |
| VII. | එම්.සී.එම්.මුස්තාපා මැතිතුමා, බකිණිගහවෙල,මැදගම | - සාමාජික |

**(2) <u>නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව:</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තියේ විධි විධාන ප්‍රකාරව නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව පිහිටුවිය යුතු බැවින්, ඒ සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කාරක සභාව පිහිටුවීම සුදුසු බවට මම මේ සභාවට යෝජනා කරමි.

| | | |
|---|---|---|
| I. | ගරු සභාපති රංජිත් පියදිගම මැතිතුමා | - සභාපති |
| II. | ගරු උප සභාපති කාන්ත බිමල් රත්නායක මැතිතුමා | - සාමාජික |
| III. | ගරු මන්ත්‍රී ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමා | - සාමාජික |
| IV. | ගරු මන්ත්‍රී කේ.එම්.ජයසුන්දර මැතිතුමා | - සාමාජික |
| V. | ගරු මන්ත්‍රී එම්.සී.එම්.ෂබ්රි මැතිතුමා | - සාමාජික |
| VI. | එම්.සී.එම්.මුස්තාපා මැතිතුමා,අංක:56,බකිණිගහවෙල | - සාමාජික |
| VII. | ඩී.එම්.ප්‍රදීප් කුමාර මයා,උඩගංගොඩ,බකිණිගහවෙල | - සාමාජික |
| VIII. | ඩී.එම්.ජයසුන්දර මයා,කොටබෝව පාර,02 කණුව,මැදගම | - සාමාජික |
| IX. | කේ.ජී.සුමනාවතී මිය,අලංමුල්ල | - සාමාජික |

**(3) <u>කර්මාන්ත සේවා කාරක සභාව:</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තියේ විධි විධාන ප්‍රකාරව කර්මාන්ත සේවා කාරක සභාව පිහිටුවිය යුතු බැවින්, ඒ සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කාරක සභාව පිහිටුවීම සුදුසු බවට මම මේ සභාවට යෝජනා කරමි.

| | | |
|---|---|---|
| I. | ගරු සභාපති රංජිත් පියදිගම මැතිතුමා | - සභාපති |
| II. | ගරු මන්ත්‍රී ජී.එච්.කෝකිල රුෂාන් කුමාර මැතිතුමා | - සාමාජික |
| III. | ගරු මන්ත්‍රී ආර්.එම්.අශෝක නිලන්ත මැතිතුමා | - සාමාජික |
| IV. | ගරු මන්ත්‍රිණී පී.අයේෂා චතුර්නිමා කුෂාන්ති මැතිණිය | - සාමාජික |
| V. | ගරු මන්ත්‍රී දාවුද් නලීම් මැතිතුමා | - සාමාජික |
| VI. | ඒ.එම්.රංජිත් අධිකාරි මයා,සේනාපතිය | - සාමාජික |
| VII. | කේ.එම්.අනුලාවතී මිය,කීණගොඩ | - සාමාජික |
| VIII. | ඒ.දුලීප් කුමාර මයා,වැලිපිටිය,නන්නපුරාව | - සාමාජික |
| IX. | කාර්මික නිලධාරී එස්.වයි.ජේ.ආනන්ද මයා | - සාමාජික |
| X. | කර්මාන්ත විෂය භාර නිලධාරී, එස්.ඒ.එස්.නිල්මිණී මිය | - සාමාජික |

**(4) <u>පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව:</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තියේ විධි විධාන ප්‍රකාරව පරිසර හා පහසුකම් පිළිබඳ කාරක සභාව පිහිටුවිය යුතු බැවින්, ඒ සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කාරක සභාව පිහිටුවීම සුදුසු බවට මම මේ සභාවට යෝජනා කරමි.

| | | |
|---|---|---|
| I. | පූජ්‍ය මැදගම චන්ද්‍රාලෝක හිමි,නිල්වලාගොඩ විහාරස්ථානය, අලංමුල්ල | - අනුශාසක |
| II. | ගරු සභාපති රංජිත් පියදිගම මැතිතුමා | - සභාපති |
| III. | ගරු උප සභාපති කාන්ත බිමල් රත්නායක මැතිතුමා | - සාමාජික |

IV. ගරු මන්ත්‍රී එම්.සී.එම්.ෂබ්රි මැතිතුමා - සාමාජික
V. ගරු මන්ත්‍රී ජී.එච්.කෝකිල රුෂාන් කුමාර මැතිතුමා - සාමාජික
VI. ගරු මන්ත්‍රී ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමා - සාමාජික
VII. ගරු මන්ත්‍රිණී යූ.ටී.එම්.තරංගා චිත්‍රාණි පුෂ්පලතා මැතිණිය - සාමාජික
VIII. ආනන්ද විජේවීර ගුණරත්න මයා,දඹකැනැල්ල,මැදගම - සාමාජික
IX. මු.සරත් දිසානායක මයා,එගොඩ පාර,13 කණුව,බකිණිගහවෙල- සාමාජික
X. කාර්මික නිලධාරී එස්.වයි.ජේ.ආනන්ද මයා - සාමාජික
XI. පරිසර විෂයභාර නිලධාරී, ආර්.එම්.ඒ.එන්.බණ්ඩාර මයා - සාමාජික

**(5) <u>සභා කටයුතු නියාමනය කිරීමේ කමිටුව:</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තියේ විධි විධාන ප්‍රකාරව සභා කටයුතු නියාමනය කිරීමේ කමිටුව පිහිටුවිය යුතු බැවින්, ඒ සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කාරක සභාව පිහිටුවීම සුදුසු බවට මම මේ සභාවට යෝජනා කරමි.

I. ගරු සභාපති රංජිත් පියදිගම මැතිතුමා -සභාපති
II. ගරු උප සභාපති කාන්ත බිමල් රත්නායක මැතිතුමා - සාමාජික
III. ගරු මන්ත්‍රී ඒ.එම්.ප්‍රේමපාල මැතිතුමා - සාමාජික
IV. ගරු මන්ත්‍රී ජේ.ජී.නිමල් සරත් කුමාර මැතිතුමා - සාමාජික
V. ගරු මන්ත්‍රී එම්.සී.එම්.ෂබ්රි මැතිතුමා - සාමාජික
VI. ගරු මන්ත්‍රී මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමා - සාමාජික
VII. ගරු මන්ත්‍රී පී.එම්.අමරපාල මැතිතුමා - සාමාජික
VIII. ගරු මන්ත්‍රී එම්.ඒ.එම්.රසිදු මැතිතුමා - සාමාජික
IX.ගරු මන්ත්‍රිණී ආර්.එම්.තුෂාරී ප්‍රියදර්ශනී රත්නායක මැතිණිය - සාමාජික
X. ගරු මන්ත්‍රී ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමා - සාමාජික

**(6) <u>ප්‍රසම්පාදන (මිල ගණන්) කමිටුව පත් කිරීම.</u>**

මැදගම ප්‍රාදේශීය සභාවට අවශ්‍ය උපකරණ /ද්‍රව්‍ය /සේවා සැපයීම් ලබා ගන්නා මිල ගණන් සඳහා ප්‍රසම්පාදන (මිල ගණන් ) කමිටුව සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කමිටුව පිහිටුවීම සුදුසු බවට මම මේ සභාවට යෝජනා කරමි.

I. ගරු සභාපති රංජිත් පියදිගම මැතිතුමා - සභාපති
II. ගරු මන්ත්‍රී ජේ.ජී. නිමල් සරත් කුමාර මැතිතුමා - සාමාජික
III. ගරු මන්ත්‍රී පී.එම්.අමරපාල මැතිතුමා - සාමාජික
IV. සභා ලේකම් ඩබ්.එම්.ඒ.එස්.බංඩාර මහතා - සාමාජික
V. ප්‍රධාන කළමනාකරණ සහකාර එස්.ඒ.එස්.නිල්මිණි මිය - සාමාජික
VI. කාර්මික නිලධාරී එස්.වයි.ජේ.ආනන්ද මයා - සාමාජික
VII. කළමනාකරණ සහකාර පී.ජී.චරිතා තරංගණී මිය - සාමාජික

**(7) <u>ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ කමිටුව :</u>**

නිවාස හා නගර කර්මාන්ත අඥා පනතේ හා ඌව පළාත් විෂය භාර අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2013.06.28 දිනැති අංක:1816/43 යටතේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලදුව 2013.11.14 දින ඌව පළාත් සභාවේ සම්මත කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ ii කොටසේ ප්‍රාදේශීය සභාවේ බලතල අනුව බල ප්‍රදේශයේ ගොඩනැගිලි හා ඉදිකිරීම් සැලසුම් අනුමත කිරීමේ කමිටුව ලෙස පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කාරක සභාව පිහිටුවීම සුදුසු බවට මම මේ සභාවට යෝජනා කරමි.

I. ගරු සභාපති රංජිත් පියදිගම මැතිතුමා - සභාපති
II. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා,මැදගම - සාමාජික
III. විධායක ඉංජිනේරුතුමා,මාර්ග සංවර්ධන අදිකාරිය,බිබිල - සාමාජික
IV විදුලි අධිකාරීතුමා,බිබිල - සාමාජික
IV. ප්‍රාදේශීය ඉංජිනේරුතුමා (මාර්ග) ,බිබිල - සාමාජික
V. අඩවි වන නිලධාරීතුමා ,බිබිල - සාමාජික
VI. පළාත් පාලන ඉංජිනේරුතුමා - සාමාජික
VII. සභා ලේකම්තුමා - සාමාජික
IX. කාර්මික නිලධාරීතුමා - සාමාජික
X පරිසර විෂය භාර නිලධාරීතුමා - සාමාජික

**(8) <u>තාවකාලික වත්කම් තක්සේරු කිරීමේ කමිටුව :</u>**

ප්‍රාදේශීය සභාව සතු වත්කම් තාවකාලිකව තක්සේරු කර ගැනීමට අවශ්‍ය වී ඇත් බැවින් ඒ සඳහා තාවකාලික වත්කම් තක්සේරු කිරීමේ කමිටුව කිරීමේ කමිටුව ලෙස පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් කමිටුවක් පිහිටුවීම සුදුසු බවට මම මේ සභාවට යෝජනා කරමි.

I. සභා ලේකම් ඩබ්.එම්.ජේ.එස් බංඩාර මහතා - සභාපති
II. ප්‍රධාන කළමනාකරණ සහකාර එස්.ජේ.එස්.නිල්මිණී මිය - සාමාජික
III. කාර්මික නිලධාරී එස්.වයි.ජේ.ආනන්ද මයා - සාමාජික
IV. ගිණුම් විෂය නිලධාරි,බී.එච්.ආර්.සී.ප්‍රියදර්ශණී මෙනවිය - සාමාජික
V. කළමනාකරණ සහකාර පී.ජී.චරිතා තරංගණී මිය - සාමාජික
VI. පරිසර විෂයභාර නිලධාරී, ආර්.එම්.ජේ.එන්.බණ්ඩාර මයා - සාමාජික
VII. කළමනාකරණ සහකාර ආර්.එම්.අශෝක සෙනෙවිරත්න මහතා - සාමාජික

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - පී.එම්.අමරපාල මැතිතුමා.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් විරුද්ධත්වයක් තිබේදැයි ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවෙන් විමසන ලද අතර සභාවේ එම යෝජනාව සම්බන්ධයෙන් විරුද්ධත්වයක් ඇති නොවූ හෙයින් උක්ත යෝජනාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත සභා සම්මත විය.

**<u>05.08.යෝජනාකරු :- ගරු සභාපති රංජිත් පියදිගම මැතිතුමා</u>**

**<u>යෝජනාව :- 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.</u>**

2023 වර්ෂයේ මැදගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ ඉදිරි කටයුතු පවත්වාගෙන යෑම සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇති අතර, ඉදිරි වර්ෂයේ කටයුතු එම සැලැස්මට අනුව පවත්වාගන යෑම සුදුසු බව මෙම ගරු සභාවට මම යෝජනා කරමි.

යෝජනා ස්ථිරත්වය :- ගරු මන්ත්‍රී - ජී.එච්.කෝකිල රුෂාන් කුමාර මැතිතුමා

ගරු සභාපතිතුමන් විසින් උක්ත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලද අතර, යෝජනාව සම්බන්ධයෙන් සභාව විරුද්ධත්වයක් ප්‍රකාශ නොකර එකඟත්වය පළ කළ හෙයින් යෝජනාව ඒකමතිකව සභා සම්මතවීය.

**06. <u>කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u> :-** නැත

**07. <u>ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශනය</u> :-**

2022 දෙසැම්බර් මාසයට අදාළ ආදායම් වියදම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට

යෝජනාව :- ගරු මන්ත්‍රී - කේ.එම්.ජයසුන්දර මැතිතුමා

යෝජනා ස්ථිරත්ව :- ගරු මන්ත්‍රී - ආර්.එම්.අශෝක නිලන්ත රාජපක්ෂ මැතිතුමා

උක්ත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන් සභාවේ එකඟතාවය විමසන ලද අතර, එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලය විවිධවූ අදහස් ඉදිරිපත් කරන ලදි.

<u>බන්දුල මන්ත්‍රීතුමා</u>
ආදායම් යටතේ මුලින්ම ඇති වාහන 03 ටම ආදායමක් හිමිවී නොමැත.

<u>පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා</u>
වාහනවලට තෙල් ගහලා කරන්නේ සභාවේ පොදු වැඩයි. පොළ භූමිය සකස් කිරීම,ළමා උද්‍යානය සැකසීම් වැනි පොදු කටයුතු සිදු කරනවා. දවසක් වැඩ කිරීමට රුපියල් 30000.00 ක පමණ තෙල් අවශ්‍ය වේ.මිල ප්‍රශ්නය හේතුවෙන් මුදල් ලබා ගන්නා වැඩ සිදු නොකර බව සඳහන් කරන ලදි.මල ගෙදරක් සිදුවූ විට ඒ අවට පිරිසිදු කර දීමට සභාවෙන් යන්ත්‍ර සූත්‍ර ලබාදීමට සිදුවේ.
<u>බන්දුල මන්ත්‍රීතුමා</u>
වෙනත් ආදායම් යටතේ සම්මන්ත්‍රණ ශාලාවේ ආදායම ඇතුලත් වී නැත.
<u>ගරු සභාපතිතුමා</u>
සම්මන්ත්‍රණ ශාලාවට ආදායම් ලැබී නොමැත. බන්දුල මන්ත්‍රීතුමන් මුදල් ගෙවා ඇත්තේ නොවැම්බර් මාසයට බව පෙන්වාදෙන ලදි. මේ දෙසැම්බර් මස ආදායම් සාරාංශය බව සඳහන් කරන ලදි. එයටද ගෙවීම කර ඇත්තේ වැරදි ආකාරයටයි. සම්මන්ත්‍රණ ශාලාව වරුවකට කියා වෙන් කලද එහි නැවත වැඩසටහනක් කිරීමට අවස්ථාව නොලැබේ. එනිසා දිනය සඳහා වෙන් කිරීම කල යුතුයි.
<u>බන්දුල මන්ත්‍රීතුමා</u>
වරුවකට වෙන් කිරීමට හැකියාව තිබෙන බව පැවසූ නිසයි ඒ ආකාරයට මුදල් ගෙව්වේ.එසේ නොමැති නම් දිනයකට මුදල් ගෙවීම ගැටළුවක් නොවන බව ප්‍රකාශ කරන ලදි.
<u>නිමල් මන්ත්‍රීතුමා</u>
ගැසට් පත්‍රයේ පවතින ආකාරය වෙනස් කර අයකිරීම දිනකට යනුවෙන් සකස් කර ගැනීම සුදුසුයි.

බන්දුල මන්ත්‍රීතුමා
සංග්‍රහ වියදම් මෙපමණ ප්‍රමාණයක් වැඩිවී ඇත්තේ ඇයිදැයි විමසීමක් කරන ලදි.
ගරු සභාපතිතුමා
සභාවේ පවත්වන මාසික සභා රැස්වීම්, විශේෂ මහසභා ඇතුළු අනෙක් සියළු වැඩසටහන් සඳහා සිදුකරන සංග්‍රහ වියදම් එකම අයිතමයකින් පෙන්වයි.

ඒ අනුව ගරු සභාපතිතුමන් විසින් නැවතත් 2022 දෙසැම්බර් මාසයට අදාල ආදායම් වියදම් සාරාංශ සම්බන්ධයෙන් සභාවේ ඇති එකඟතාවය විමසන ලදි. එහිදී ගරු මන්ත්‍රී උදය බන්දු මැතිතුමන් 2022 දෙසැම්බර් මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව සඳහා විරුද්ධත්වය ප්‍රකාශ කර බෙදුමක් ඉල්ලා සිටින ලදි. එම අවස්ථාවේ ගරු මන්ත්‍රී - ඩබ්.එම්. උදය බන්දුල මැතිතුමන් කළ යෝජනාව සම්බන්ධයෙන් සෙසු ගරු මන්ත්‍රී මණ්ඩලය එකඟත්වය පල නොකල බැවින් 2022 දෙසැම්බර් මාසයට අදාළ ආදායම් වියදම් වාර්තාව සඳහා ගරු මන්ත්‍රී - ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමන්ගේ විරුද්ධත්වය සටහන් කරගත් අතර, සෙසු ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකමතික කැමැත්ත මත ආදායම් වියදම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස සභා සම්මත කර ගන්නා ලදි.

## 08.හදිසි කරුණු හා වෙනත් කරුණු

### 08.01.සතිපොළ පිළිබද හා සතිපොළ පොදු වැසිකිළිය සම්බන්ධයෙන් සාකච්ඡාව

කෝකිල මන්ත්‍රීතුමා
පොළේ ඇති කොටසකින් සෑම සතියකම රුපියල් 500.00 ක මුදලක් අය කරයි. සභාවේ තීරණය කර ඇත්තේ රු.300.00 ක මුදලක් අය කිරීමටයි. රුපියල් 500.00 ක මුදල ලබා නොදෙයි නම් එම ස්ථානයෙන් ඉවත් කිරීමට බලපෑම් කරන අවස්ථාද පවතින බව පෙන්වා දෙන ලදි.
නිමල් මන්ත්‍රීතුමා
පොළ බදුකරු පොළ ගාස්තුව වශයෙන් රු.500.00 ක මුදලක් අය කරයි.එයට අමතරව පොලේ කොටස අල්ලා ගත් පුද්ගලයාටත් රු.500.00 ක මුදලක් ගෙවිය යුතුවේ. එවිට ව්‍යාපාරිකයා රුපියල් 1000.00 ක මුදලක් බදු වශයෙන් ගෙවීමට සිදුවේ.
ෂබ්රි මන්ත්‍රීතුමා
පසුගිය වර සභාවේදී කතා කලේ පොළට බඩු දාන පුද්ගලයාට පොළේ බිම් කොටස් ලබාදීමටයි.නමුත් ඔවුන්ට ඒසේ සාධාරණයක් ඉටුවී නැත.
නිමල් මන්ත්‍රීතුමා
මැදගම පොදු වැසිකිළිය සඳහා සතිපොළ දිනයට කවුරුන් හෝ යෙදවීමට සිදුවේ. එසේ නොමැති නම් එම ස්ථානයට යැමටවත් නොහැකි තත්වයකුයි පවතින්නේ.
ගරු සභාපතිතුමා.
පොළ දිනයට සෞඛ්‍ය කම්කරුවන් යොදවා සිටියද පුරුද්දක් ලෙස ඔවුන් සෙනසුරාදා දිනයට රාජකාරිය සඳහා නොපැමිණෙයි.සෑම දිනකම සභාපතිතුමන් හා උප සභාපතිතුමන් පැමිණ සොයා බලා ජේ.සී .බී යන්ත්‍රය හෝ යොදවාගෙන නගරය පිරිසිදු කරවන්නේ.එනිසා මෙම කම්කරුවන් නියමිත දිනට සේවයට වාර්තා නොකරන්නේ නම් දින දෙකක වැටුප කැපීමට තීරණයක් ලබා ගනිමු.
බන්දුල මන්ත්‍රීතුමා
එම යෝජනා සුදුසු වන බව ප්‍රකාශ කරන ලදි.
නිමල් මන්ත්‍රීතුමා
අදාළ යෝජනාව සුදුසු වේ. කම්කරුවන් තිදෙනා යොදවා ඇත්තේ පොළ භූමිය පිරිසිදු කිරීමටද වැසිකිළිය පිරිසිදු කිරීමටද විමසීමක් කරන ලදි.

ගරු සභාපතිතුමා
උදෑසන 6.00 සිට පැමිණීමට උපදෙස් දෙන්නේ උදෙන්ම වැසිකිලිය පිරිසිදු කිරීමටයි.

නිමල් මන්ත්‍රීතුමා
වැසිකිළිය පිරිසිදු කිරීමට දවස පුරාම සිටින්නට සේවකයකු යොදවන ලෙසට යෝජනාවක් ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමා
පොළ දිනයේ දවස පුරා එක් පුද්ගලයකු වැසිකිළිය සඳහා යොදවමු. පසුගිය සඳුදා දිනයේ උදෑසනින් පොළට වතුර නැති බව පවසමින් සභාපතිතුමන්ට දුරකථන ඇමතුමක් ලබාදුන් බව පවසන ලද අතර, එම අවස්ථාවේ සභාපතිතුමන් පැමිණ වතුර බවුසරයක් සතිපොළට යැවූ බව ප්‍රකාශ කරන ලදි. සතිපොළ කටයුතු අධීක්ෂණය සඳහා ආදායම් පරීක්ෂකවරයකු හා වෙළඳ සැල් පරිපාලකවරයකු පත්කර සිටියද දෙදෙනාගෙන් එක් අයකුවත් පොළට ගොස් කිසිවක් සොයා නොබලයි. වතුර නැති බව පොළ බදුකරුටවත් නොපවසා ව්‍යාපාරිකයින් සභාපතිතුමන්ට දැනුම් දෙන බව ප්‍රකාශ කරන ලදි.

## 08.02.මැදගම මහජන පුස්තකාලය සම්බන්ධයෙන් සාකච්ඡාව

ගරු සභාපතිතුමා
සෙනසුරාදා දිනයේදී පුස්තකාලයේ විශාල ගැටළුවක්ව පවතියි. පාසල් ළමුන් ජෝඩුපිටින් පැමිණ රැඳී සිටියි. පුස්තකාලයේ කටයුතු නිසිලෙස පවත්වාගෙන යෑමට නොහැකිවේ. ළමුන් පන්තියට යන බව පවසා පුස්තකාලය තුලටවී සිටියි. එය විශාල ගැටළුවකි.එනිසා මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම් කල යුතු බව පෙන්වා දෙන ලදි.

නිමල් මන්ත්‍රීතුමා
පුස්තකාලයේ රැඳී සිටීමට වේලාවක් නියම කිරීමට හැකියාවක් නොවේ.

ගරු සභාපතිතුමා
පොත් කියවීම සඳහා බව පවසමින් ළමුන් පුස්තකාලයට පැමිණයි මේ කටයුතු සිදු කරන්නේ.එනිසා
ළමුන්ට වේලාව පවසමින් පුස්තකාලයෙන් යන්නට කියා පැවසිය නොහැකියි. මේ ආකාරයට දරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වේ.ඊයේ දිනයේ මැදගම පාසලේ දරුවන් ලඟ අයිස් මත්ද්‍රව්‍ය තිබී හසුවූ බවට තොරතුරක් ලැබුන බව පවසන ලදි.

බන්දුල මන්ත්‍රීතුමා
යම් සිදුවීමක් පසුගිය දිනක මැදගම නගරයේ පවතින පාසලක සිදුව තිබේ. දරුවන් කණ්ඩායමක් එක්ව මත්ද්‍රව්‍ය භාවිත කර තිබේ. ගැහැණු දරුවන් පවා මේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටියි.

නිමල් මන්ත්‍රීතුමා
නුවර ප්‍රදේශයේද මෙවන් සිදුවීමක් සිදුවූ බව ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමා
සියළුම දේ යෝජනා කරන්නේ ආණ්ඩුවටයි. පාර්ලිමේන්තුවේ සිටින 225 චෝදනා කරයි. අද සමස්ත නිලධාරී මණ්ලය දෙස බලන කල ඔවුන්ගෙන් සිදුවන හානිය ඊට වඩා බරපතල වේ. ආරක්ෂාව භාරව සිටින නිලධාරීන් මෙන්ම අනෙකුත් නිලධාරීන්ගෙන් හානි සිදුවී තිබේ.

බන්දුල මන්ත්‍රීතුමා
එවන්දේ සිදුවේ. එනමුත් මේවා මෙහෙයවන යතුර ඇත්තේ පාර්ලිමේන්තුවේ.

කෝකිල මන්ත්‍රීතුමා
කුඩා ළමුන්ට ගෙන එන චොකලට් එක, ටොපිය , බැලුම් බෝලය චෙක්කර ඒවා ඉවත් කරයි. එනමුත් රැගෙන එන මත්ද්‍රව්‍ය අල්ලා ගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවේ.මේ සඳහා දේශපාලන අධිකාරිය වගකිව යුතුවේ.

බන්දුල මන්ත්‍රීතුමා

පොලීසියෙන් අල්ලන ගංජා ආදී මත්ද්‍රව්‍ය කෝ. ඒවා නැවත ව්‍යාපාරයක් ලෙස නැවත එලියට යන බව බොහෝ දෙනකු දනියි.

<u>ගරු සභාපතිතුමා</u>

පොලීසියෙන් සොයා ගන්නා මත්ද්‍රව්‍ය උසාවියේදී ගිණි තැබීම බොහෝදුරට කෙරෙන කාර්යයි. නමුත් එසේ කරන අවස්ථාවල පසු ගිය කාලයේ ඇත් දළ අල්ලා ගත් අවස්ථාවේ ඒවා බෝට්ටුවකින් වෙනත් ස්ථානයකට ගෙන ගොස් තිබුණි.

<u>ෂබ්රි මන්ත්‍රීතුමා</u>

උසාවියෙන් වරදකරුවන් එදිනම නිදහස් කර එවීමට කටයුතු කරයි.

<u>ගරු සභාපතිතුමා</u>

පසුගිය දිනක සභාවේ වල්කපන මැෂින් එකක් සඳහා තෙල් ලීටර 05 සභාපතිතුමා ලබාදුන් පසු එක තෙල් ලීටරයක කෑන් එකක් සඟවා තබා තිබේණු දුටු බව ගරු සභාපතිතුමන් පෙන්වා දෙන ලදි. වල් කැපීමට ගිය පසු කොපමණ තෙල් ප්‍රමාණයක් වැය වෙන්නේද කියා බැලීමට ඔවුන් පස්සෙන් කවුරුන්ට හෝ යෑමට සිදුවී තිබේ. මෙය විශාල ගැටළුවක් වන බව සඳහන් කරන ලදි.මැෂින් එකට අලුත් තලයක් යෙදූවිට එය ගෙදර මැෂින් එකට සවිකර පරන තලයක් නැවත සභාවේ මැෂින් එකට සවිකර ගනියි. පාර කැපීමට ගිය පසු මැෂින් එකේ තෙල් ඉවරවූ පසු නැවත සභාවට එයි. නමුත් ඔවුන් කැත්තක් අරන් ගියද එයින් වැඩ නොකර තෙල් ඉවර බව පවසමින් සභාවට එනවා.මිනිසුන් පුරුදුවී සිටින ආකාරය වෙනස් කිරීම ඉතා අපහසු කාරයයකි.

**<u>09.ගරු මන්ත්‍රීතුමන්ලා / ගරු මන්ත්‍රීතුමියන්ලා විසින් අදහස් හා යෝජනා ප්‍රකාශ කිරීම</u> :-**

**<u>09.01.ගරු මන්ත්‍රී - ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමා</u>**

ගරු මන්ත්‍රී ඩබ්.එම්.උදය බන්දුල මැතිතුමන් සභාවට අදහස් දක්වමින්, සභාව තුල ඇත්ත වශයෙන්ම කතා කිරීමට දෙයක් නොපවතිනවා නොව කතා කිරීමට දේවල් පිරී ඉතිරී තිබුනද ඒවා කතා කිරීමෙන් ප්‍රයෝජනයක් නොමැති බව මුලින්ම සඳහන් කරන ලදි. කොපමණ කතා කලත් ඒ ඇත්ත පිළිගැනීමට උත්සාහ නොකරයි. රැකියා සම්බන්ධයෙන් කතා කලොත්, පොළ ගැන කතා කලොත්, පොලේ ඇතිවූ ගැටුම් ගැන කතා කලොත්, පෙට්‍රල් හොරකම් කිරීම පිළිබඳව කතා කලොත් එහි යථාර්තයට ගමන් කිරීමට සිදුවේ. උඩින් සොයා බැලුවට කිසිදු තේරුමක් නොවේ. ඒ තුලින් ගැටළු සඳහා විසඳුම් නොලැබේ. එනිසා සත්‍ය වශයෙන්ම පුද්ගලයකුහට රැකියාවක් ලබාදුන් පසු ඒ රැකියාව ලබාදීමේ අයිතිය ඇතුළු සියළුමදේ වඩාත්ම සුදුස්සාට හිමිවේ. ලංකාවට ගැලපෙනම දේ වන්නේ ඔවුන්ගේ සුදුසුකම් අනුව චක්‍රලේඛනයකින් හෝ රැකියාව ආණ්ඩුවෙන් පිරි නැමිය යුතුවේ. උදාහරණයක් ලෙස 2004 වර්ෂයේ පමණ උපාධිදාරීන් 35000.00 කට අධික සංඛ්‍යාවක් සිටි අතර, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිතුමියගේ රජය මැදිහත්ව රැකියා ලබාදීමට කටයුතු කළෙමු. එම අවස්ථාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය හා මන්ත්‍රීතුමන්ලාගේ පක්ෂය සිටි බව පෙන්වාදෙන ලදි. එම අවස්ථාවේ රැකියා ලබාදීමට විවිධ පක්ෂවලට බෙදා ගැනීම උත්සාහ ගත් අවස්ථාවේ මන්ත්‍රීතුමන්ලාගේ පක්ෂයෙන් එසේ බෙදා ගැනීමට අවශ්‍ය නොවන බව පවසමින් මේවා ආණ්ඩුවේ රැකියා ඒ අය සියළුම දෙනා උපාධිදාරීන් එනිසා සියළුම දෙනාට රැකියා ලබා දීමටයි. යෝජනා කර තිබූයේ. එසේ රැකියා ලබාදීමේදී සියළුම පක්ෂ නියෝජනය කරන අයට රැකියා හිමිවිණි. රටේ රැකියා ගැන කතා කරන විට මම රැකියාව දුන්නාද මම පඩි දෙනවාද, මට වැඩ කලාද යන්න අදාළ නොවේ. පොදුවේ මිනිසුන්ට අවස්ථාව ලබාදෙන තැන මන්ත්‍රීතුමන්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි. ඔවුන්ට බලපෑම් කිරීම සිදු නොකල යුතුවේ. අද සමාජයේ ඡන්ද නිසා මම රැකියාව දුන්නා එනිසා ඔබ මට වැඩ කල යුතුයි, සමෘද්ධිය

ලබාදුන්නා ඔබ මට වැඩ කල යුතුයි.ෂීට් ටික මම දුන්නා ඔබ මට වැඩ කල යුතුයි. සිතා කටයුතු කරන බොහෝ පිරිස් සිටියි.

එවැනි බලපෑම් සහිත වැරදි දේශපාලන රටාවක් පවතියි. මිනිසුන් නොමග යවා තිබේ. එනිසා මේ සමාජය තුල හොරකම් කරන්නේ,වංචා කරන්නේ ඉහල නායකයා හා රාජ්‍ය සේවකයා දෙස බලා පහළ සිටින නායකයා හා රාජ්‍ය සේවකයා හොරකම් කරන තැනට පත්ව සිටියි. මේ සඳහා මොන තරම් වෙහෙසුනත් සොයා ගැනීමට පිළිතුරු නැත. තවත් අගතියට පත්වේ. මන්ත්‍රීතුමන්ලා ඕනෑතරම් ප්‍රශ්න නගයි, වාද විවාධ ඇති කර ගනියි,අපහාස කර ගනියි ඒ මොනදේ කලත් මන්ත්‍රීතුමන්ට අවශ්‍ය වන්නේ මේ සමාජය නිවැරදි වීමයි. දේශපාලඥයින්, මේ සමාජයේ සිටින කවුරුවත්, මෙම ස්ථානයේ සිටින කෙනකුවත් අමනාපවී අපහසුතාවයට පත්වනවා දකින්නට අකමැතිවේ. කවුරුත් සතුටින් සන්තෝශයෙන් හොදට කලා බීලා ඇදලා පැලදලා ඉන්නවා දැකීමටයි මන්ත්‍රීතමන්ලා කැමැත්තක් දක්වන්නේ බව පෙන්වා දෙන ලදි. කවුරුන් වුවත් මන්ත්‍රීතුමන් හොදනෑ කුහකයි කියා පැවසුවත් එතුමන් කුහක නොවන බව සදහන් කරන ලදි. එතුමන්ට කිසිවක් අදාළ නොවන බවත්, මන්ත්‍රීතුමන්ට අවශ්‍ය වන්නේ මිනිසුන් බව සදහන් කරන ලදි. ජාති භේද, ආගම් භේද, කුල භේද මන්ත්‍රීතුමන්ට අදාළ නොවන බව ප්‍රකාශ කරන ලදි. එසේ බෙදා වෙන්කල නිසා තමයි රටක් වශයෙන් ලෝකයේ රටවලට යෑමට අවස්ථාව අහිමිවී ඇත්තේ. ලෝකයේ කිසිදු රටකින් ලංකාවේ අය ගෙන්වා ගැනීමට අකමැතිවේ.වැඩට ගෙන්වා නොගනියි. ඒ තත්වයෙන් රට බේරා ගැනීමට හැකියාව පවතින්නේ පොදුජන පෙරමුණටද,එක්සත් ජාතික පක්ෂයටද, සමගි ජනබල වේගයටද,ජාතික ජනබල වේගයටද ,ජනතා විමුක්ති පෙරමුණටද නොවෙයි. පොදු වැඩපිලිවෙලක් රටට සකස් විය යුතුයි. එසේ සකස් වූ පසු මේ කාටත් එක අම්මාගේ දරුවන්සේ සමගියෙන් සිටීමට දවසක් මේ රටට උදා කරන්නට අවශ්‍ය බව යෝජනා කරමින් ගරු මන්ත්‍රීතුමන්ගේ අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>09.02.ගරු මන්ත්‍රී - ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමා</u>**

ගරු මන්ත්‍රී ඒ.ජී.මහේෂ් චින්තක බණ්ඩාර මැතිතුමන් සභාවට අදහස් දක්වමින්, අද දින පවත්වනුයේ මෙම සභාවේ අවසන් සභා වාරය වීමට හැකියාව තිබෙන බව මුලින්ම සදහන් කරන ලදි. එබැවින් ගරු මන්ත්‍රීතුමන් නියෝජනය කරන කැන්දවින්න කොට්ඨාශයේ පිටදෙනිය හෙල අරාව ගම්මානයට යන මාර්ගය භාවිත කරන පවුල් 45 ක් 50 ක් පමණ පදිංචිව සිටින, අක්කර 250 ක් 300 ක් පමණ වගා කර ඇති ගම්මානයේ මාර්ගයේ ආරම්භක ස්ථානය කොට පැටවීම හේතුවෙන් කොන්ක්‍රීට් තට්ටුව තැනින් තැන කැඩීගොස් තිබේ. එම කොටස සකස් කිරීමට පොඩි මුදලක් වැයවේ. මේ සම්බන්දයෙන් ගම්වාසීන් ලිපියක් මහින්ද දැනුම් දී ඇති බැවින් කඩිනමින් එම මාර්ගය පිළිසකර කරදෙන ලෙසට ඉල්ලීමක් කරන ලදි.

ඒවාගේම කැන්දවින්න කොස්වත්ත මාර්ගය පවුල් 80 කට පමණ වැඩි පිරිසක් පදිංචි මාර්ගයකි. එම මාර්ගයේ කොස්වත්ත හංදියේ සිට කිලෝමීටර් 01 කක ප්‍රමාණයක් කොන්ක්‍රීට් කර තිබේ. එතැන්සිට පණික්කාවත්තට යන මාර්ග කොටසේ ස්ථාන 02 ක් ගමන්කිරීමට නොහැකි මට්ටමට පත්ව තිබේ. එම මාර්ගයේ පාලමද අබලන් තත්වයේ පවතියි. එනිසා මේ පිළිබදව ගරු සභාපතිතුමන්ගේ අවධානය යොමු කර අදාළ මාර්ගය කපා පිළිසකර කරදෙනමෙන් ඉල්ලීමක් කරමින් ගරු මන්ත්‍රීතුමන්ගේ අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>09.03.ගරු උප සභාපති - ආර්.එම්.කේ.බිමල් රත්නායක මැතිතුමා</u>**

ගරු උප සභාපති ආර්.එම්.කේ.බිමල් රත්නායක මැතිතුමන් සභාවට අදහස් දක්වමින්, ගරු උප සභාපතිතුමන් නියෝජනය කරන මැදගම කොට්ඨාශයේ ප්‍රධානම ගම්මානය වන්නේ මීගවගුර ගම්මානයයි. මීගහවගුර ගම්මානය සදහා මේ වසර 05 ක ධූර කාලයතුල කාපට් මාර්ගයක් ලබා

ගැනීමට හැකියාව ලැබුන බව පෙන්වාදෙන ලදි. පසුගිය දිනක 10 කණුව ප්‍රදේශයේ පැවති උද්ගෝෂණය හේතුවෙන් අදාළ මාර්ගය විශාල පිටුවහලක් විය. එදින විකල්ප මාර්ගයක් ලෙස මීගහවගුර මාර්ගය යොදා ගැනීම සතුටට කරුණක් වූ බව සඳහන් කරන ලදි. එසේම එම ගම්මානයේ මීගවගුර ගම්මාන මාර්ගයක් පවතියි. ඒ මඩමේවත්ත මාර්ගය වසර 03 ක පමණ කාලයක් පිරිසිදු කිරීමක් සිදුකර නොමැත. එනිසා සභාවේ කම්කරුවන් කිහිප දෙනකු යොදවා මාර්ගය පිළිසකර කරදෙන ලෙසට ඉල්ලීමක් කරන ලදි.

එසේම එදා ඒ උද්ගෝෂණය පවත්වන අවස්ථාවේ විකල්ප මාර්ග සොයන විට කැන්දවින්න මාර්ගයෙන් මීගහවගුර මාර්ගයට යෑමට පිටදෙනියට ආසන්නයෙන් මාර්ගයක් පවතියි. එයද මීගහවගුර ප්‍රජා ශාලාව අසලට වැටෙන පාලම ඉදිරියේ මීටර් 50 ක පමණ කුඩා කොටසක් මඩවී අබලන් තත්වයට පත්ව තිබේ. එම ස්ථානයෙන් පාසල් ළමුන්ට ගමන් කිරීමට නොහැකි තත්වයක් උදාවී තිබේ. ඒ සඳහා පිළියමක් යොදා සකස් කර දෙනාවා නම් සුදුසු යැයි ගරු සභාපතිතුමන් යෝජනා කරමින් ගරු උප සභාපතිතුමන්ගේ කෙටි අදහස් දැක්වීම නිමා කරන ලදි.

<u>පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා</u>

බල ප්‍රදේශයේ ඇති කාපට් මාර්ග සියල්ල සභාවට පැවරීමට කටයුතු කරන බවත්, මාර්ග සංඥා පවා සකස් කිරීමට ඇත්තේ සභාවටයි. කාපට් මාර්ග නඩත්තු කිරීමට සිදුවන්නේද සභාවටම බව පෙන්වා දෙන ලදි.

**<u>09.04.ගරු සභාපති - රංජිත් පියදිගම මැතිතුමා</u>**

2023 වර්ෂයේ පළමු සභා රැස්වීමේ කටයුතු නිමා කිරීමට සභාව ඇමතූ ගරු සභාපතිතුමන්, අද දින සභා රැස්වීමේ කටයුතු සඳහා සහය වෙමින් අදහස් දැක්වූ ගරු උප සභාපතිතුමන් ඇතුළු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයට ස්තූතිය පුද කරන ලදි.

ළමා උද්‍යානයේ කටයුතු වර්තමානය වන විට සිදු කෙරෙමින් පවතින අතර, කුඩා වියදමක් දරා කටුමැටිවලින් ගැමි ගෙදරක් නිර්මාණය කරන බවත්, ඈත අතීතයේ තිබූ ගැමි ගෙදරක් නිර්මාණය කිරීමට උත්සාහ ගන්නා බව ප්‍රකාශ කරන ලදි. මේ සඳහා පැරණි කාලයේ පැවතුනාවූ මුළුතැන්ගෙයි උපකරණ හට්ටි, මුට්ටි, මුව අං තට්ටු ආදිය සොයා ගැනීමට සිදුවේ. එවැනි උපකරණ ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවෙස් වල පවතින්නේ නම් වර්තමානයේ දරුවන්ට පෙන්වීම සඳහා තැබීමට උත්සාහ ගන්නා බව ප්‍රකාශ කරන ලදි. පැරැන්නන් භාවිත කල දෑකැත්ත, උකුණු ගහ, බෝල අත්ත වැනි උපකරණද තැබීමට බලාපොරොත්තු වන බව සඳහන් කරන ලදි. අපේ මුතුන් මිත්තන් භාවිත කල පෞරාණික දේ තිබේ නම් පරිත්‍යාග කරන්නේ නම් පරිත්‍යාග නාමලේඛනය වුවද සඳහන් කිරීමට හැකියාවක් පවතින බැවින් අන් අයගේ දැන ගැනීම සඳහා ගෙනවිත් තබන ලෙසට ඉල්ලීමක් කරන ලදි.

එයට අමතරව ඊට එහා පැත්තෙන් භාවන් දැමීමට හැකි කූඩුවක් සකස් කර තිබෙන බවත්, එසේම කුරුළු කූඩුවක්ද දරුවන්ට නැරඹීමට සකස් කර තිබෙන බව සඳහන් කරන ලදි. එක් දිනක පෙරපාසල් ළමුන් කැඳවා ගතහොත් ඒ ළමුන් සඳහා ආහාර වේලක්ද ලබාදී මට කටයුතු කරන බවත්, සතුන්ට අවශ්‍ය ආහාර පැමිණෙන අයට රැගෙන ඒමට හැකියාව තිබේ. දවස පුරා දරුවන් එම ස්ථානයේ තබාගෙන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් කවුරුන් හෝ ගෙන්වා ගෙන දරුවන්ට හා දෙමාපියන්ට දේශණයක් පවත්වා ළමා උද්‍යානය නිසි පරිදි ඉදිරියට පවත්වාගෙන යෑමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. ඒවාගේම ළමා උද්‍යානය ඉදිරිපිට කුඩා පාලමක් සකස් කිරීමට තිබේ. ඒ සඳහා බෝක්කු බට දෙකක් දමා සකස් කර ගෙන ඉතා කඩිනමින් ළමා උද්‍යානය දරුවන් සඳහා පවරා දීමට සැලසුම් කර තිබෙන බව ප්‍රකාශ කරන ලදි.

ඒවාගේම බස් රථයක් රැගෙනවිත් එහි පුස්තකාලයක් සකස් කිරීමට බලාපොරෙත්තුවක් තිබුනද එය තවමත් කර ගැනීමට නොහැකිවූ බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. ඉදිරියටත් කාලයක් සාභවේ කටයුතු පවත්වාගෙන යෑමට හැකියාව පැවතුනහොත් ඒ සියල්ල සම්පූර්ණ කර

පත්වන අළුත් කණ්ඩායමට ඉදිරියට බල ප්‍රදේශයේ කටයුතු පවත්වාගෙන යෑමට භාර දීමට බලාපොරොත්තුවන බව ප්‍රකාශ කරන ලදි. කොසේ හෝ ගරු සභාපතිතුමන් උත්සාහ ගන්නේ ගැමි සුවද විහිදෙන සමාජයක් අනාගත පරපුර වෙනුවෙන් සංරක්ෂණය කර යහපත් සමහාජයක් ගොඩනැගීම වන බව ප්‍රකාශ කරන ලදි.

එසේම කොටබෝව කුඩා කතරගම දේවාලයේ බස්නායක නිලමේ ධූරය සඳහා නව බස්නායක නිලමේවරයා ලෙස චන්දන මහතා පත් කර ගෙන ඇති අතර, එතුමන්ට දේවාලයේ කටයුතු සාර්ථකව පවත්වාගෙන යෑම සඳහා සුභ ප්‍රාර්ථනා එක් කරන ලදි.

තවද ළමා උද්‍යානය ආරම්භ කිරීමට පෙර කිරි අම්මාවරුන් සඳහා දානයක් පූජා කිරීමට බලාපෙරොත්තු වන බවත්, මෙම මස අවසන් වීමට පෙර එම කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇති බව ප්‍රකාශ කරන ලදි. මැදගම බල ප්‍රදේශයේ අප්‍රකට වීරවරියක් වාසය කර තිබෙනවා තිත්තවැල්කිවුල ප්‍රදේශයේ.ඇය නමින් රන්කිරි මාතාව කියා හඳුන්වනු ලබයි. එම වීර මාතවගේ නමින් ළමා උද්‍යානය නම් කිරීමට අදහස් කර තිබෙන බව සඳහන් කරන ලදි. වීර රන්කිරි මාතා ළමා උද්‍යානය ලෙස නම් කරන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදි. අතීතයේ 18 කැරැල්ලේදී මේ භූමියේ අයිතිය වෙනුවෙන් ඒ වීරවරුන් රැක ගැනීමට අත්පා 04 ම කපා දමද්දීත් රහස් හෙළි නොකර රහස් රැකි විරෝධාර මාතාව සිහිපත් කිරීමට ළමා උධ්‍යානය ඇය නමින් නම් කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදි.

ඒවාගේම ඉදිරියේදී මැතිවරණයක් ප්‍රකාශයට පත්කල හොත් බොහොමත්ම සාමකාමීව ඒ මැතිවරණයට මුහුණදී සහෝදරයින් ලෙස මේතාක්කල් සිටියාසේ ඉදිරියටත් කටයුතු කර ජනතාවගේ අභිලාශයන් ප්‍රකාශයට පත් කිරීමට අවස්ථාව ලබාදෙමු. ජනවාරි මස 21 වන දින වන විට නාම යෝජනා භාර දීම අවසන්වේ. එම අවස්ථාවට කුඩා පිරිසකට සහභාගී වන ලෙසයි මැතිවරණ කොමසාරිස්තුමන් උපදෙස් ලබාදී ඇත්තේ. ඉදිරියේදී උසස් පෙළ විභාගය ආරම්භවීමට යෝජිතව ඇති බැවින් අනවශ්‍ය පෙළපාලී පවත්වා ඒ දරුවන්ට බාධා ඇති නොකර කටයුතු කිරීමට යෝජනා කරන ලදි. පළාත් පාලන මැතිවරණයක් යනු කෑකෝගසමින් හුරේ දමන මැතිවරණයක් නොවේ. ගෙයින් ගෙට ගොස් තමන්ගේ හැකියාවන්, පලපුරුද්ධ , දක්ෂතාවය ගැන සඳහන් කර පක්ෂයේ ප්‍රතිපත්ති කියාදී ජනතාවගේ සහය ලබාගෙන තමන්ට හැකි සේවයක් ජනතාවට සිදුකිරීමයි.

බොහෝවිට මන්ත්‍රී සංඛ්‍යාව අඩු කිරීමේ ප්‍රවනතාවයක් ආණ්ඩුව තුල පවතියි.විශේෂයෙන් තරුණ ප්‍රජාවට හා කාන්තාවන්ට මූලිකත්වය ලබාදීමට අදහස් කර තිබේ. පසුගිය වර ඡන්දය ඉල්ලූ අවස්ථාවේ වයස අවුරුදු 18 – 35 ත් අතර තරුණ නියෝජනයෙන් 05 දෙනකු ලේඛනයෙන් ඉදිරිපත් කරන ලදි.12 දෙනාගෙන් 05 දෙනකු තරුණ නියෝජනයටත් අනෙක් 07 දෙනා වයසක අයවේ. මේ සංශෝධන ඉදිරිපත් කල හොත් සභාපතිතුමන්ලාට ඡන්ද ඉල්ලීමට අවස්ථාව නොලැබීමටත් අවස්ථාව තිබෙන බව ප්‍රකාශ කරන ලදි. පසුගිය කාලයේ පැවති අරගලයත් සමඟ තරුණයින්ගේ ඇතිවූ පිබිදීමත් සමඟ රජය උත්සාහ ගන්නේ ඒ තරුණයින්ට අවස්ථාව ලබාදීමටයි. එසේ ඒ නව ක්‍රමය හඳුන්වාදුනහොත් ලබාදුන් නාමයෝජනා පාර්ලිමේන්තුවේ සාකච්ඡා කර ඉවත් කිරීමට සිදුවේ.එසේ වුවහොත් නැවත වරක් නාම යෝජනා කැඳවා නව ක්‍රමයට ඡන්දය පැවැත්වීමටද හැකියාවක් ලැබේවී.එසේ මැතිවරණයක් ප්‍රකාශයට පත්වුව හොත් සියළු දේනා බොහොමත්ම සාමකාමීව මුහුණ දී මහජන සේවයට ගරු සභාපතිතුමන්ලා අවශ්‍ය යැයි පවසන්නේ නම් එතුමන්ලාට ඡන්දය ලබාදෙයි.අවශ්‍ය නොමැති නම් ඡන්දය ලබානොදී සිටියි. සභාපතිතුමන්ලා ඒ අවස්ථා දෙකටම සූදානමින් සිටින බව ප්‍රකාශ කරන ලදි.

එනමුත් ගරු සභාපතිතුමන් සභාව භාර ගත් කාලය පුරාවටම සභාපතිතුමන්ට හැකි ආකාරයෙන් වැස්සට තෙමෙමින්, අව්වට වේලෙමින් සියළු පහසුකම් සැලසුවා මිස තනතුරු වලින් සැප පහසුකම් සොයා ගිය අය නොවන බවත්, අවශ්‍ය වැඩ ප්‍රමාණය අවශ්‍ය තැනට සභාපතිතුමන් නිසි අයුරින් සිදුකර ඇති බවත්,සඳහන් කරන ලදි. නගරය තිබූ ආකාරයට වඩා අද තිබෙන තත්වය

දෙස බැලූවිට සතුටට පත්වීමට හැකියාවක් පවතින බවද සඳහන් කරමින් අද දින සභා රැස්වීමට සහභාගිව අදහස් දක්වා රැස්වීමේ කටයුතු සඳහා සහය දැක්වූ උප සභාපතිතුමන් ඇතුළු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයට නැවතත් ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමන් ඉතාමත් සාමකාමී වූ මාසික සභා රැස්වීමේ කටයුතු නිමාවට පත් කරන ලදි.

**10.** මීලඟ සභා රැස්වීම 2023.02.09 වන දින පෙ.ව. 9.30 ට මැදගම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පැවැත්වීමට තීරණය කරන ලදි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2023.01.17

මැදගම ප්‍රාදේශීය සභාව.

පිටපත්:-

| | | |
|---|---|---|
| 01. | ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමා, බදුල්ල | - කා.දැ.ගැ.ස. |
| 02. | පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා, මොණරාගල | - කා.දැ.ගැ.ස |
| 03. | විගණන අධිකාරීතුමා , මොණරාගල. | - කා.දැ.ගැ.ස |